# දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරුන්ගේ සමුළුව - 2021/02

**ස්ථානය** :- "නිල මැදුර" – 19 වන මහල

**දිනය** :- 2021.04.20 හා 21 දෙදින

**ප්‍රධානත්වය** :- ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු චමල් රාජපක්ෂ මැතිතුමා

**සහභාගීත්වය** :- ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා

**මෙහෙයවීම** :- ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්, එන්.එච්.එම්.චිත්‍රානන්ද මහතා

සහභාගීත්වය :- දිස්ත්‍රික් ලේකම්වරු / දිසාපතිවරුන් :-

| | | |
|---|---|---|
| 1. | ප්‍රදීප් යසරත්න මහතා | කොළඹ |
| 2. | සුනිල් ජයලත් මයා | ගම්පහ |
| 3. | ගිනිගේ ප්‍රසන්න ජනක කුමාර මයා | කළුතර |
| 4. | චන්දන තෙන්නකෝන් මයා | මහනුවර |
| 5. | එස්.එම්.ජී.කේ.පෙරේරා මයා | මාතලේ |
| 6. | ජී.කේ.ජී.ඒ.ආර්.පී.කේ. නන්දන මයා | නුවරඑළිය |
| 7. | ආර්.එච්. කමල් රණසිංහ මයා (රා.ආ) | ගාල්ල |
| 8. | පී.එච්.සී.රත්නායක මයා | මාතර |
| 9. | කේ.මහේෂන් මයා | යාපනය |
| 10. | ආර්.ඒ. ස්ටැන්ලි ද මෙල් මිය | මන්නාරම |
| 11. | එස්.එම්.සමන් බන්දුලසේන මයා | වවුනියාව |
| 12. | කේ.විමලනාදන් මයා | මුලතිව් |
| 13. | ආර්.කේතීස්වරන් මිය | කිලිනොච්චි |
| 14. | කේ. කරුණාහරන් මයා | මඩකලපුව |
| 15. | ඩී.එම්.එල්.බණ්ඩාරනායක මයා | අම්පාර |
| 16. | සමන් දර්ශන පාඩිකෝරාල මයා | ත්‍රිකුණාමලය |
| 17. | ආර්.එම්.ආර්.රත්නායක මයා | කුරුණෑගල |
| 18. | එල්.ජේ.එම්.ජී.සී.බණ්ඩාර මයා | පුත්තලම |
| 19. | ආර්.එම්.වන්නිනායක මයා | අනුරාධපුර |
| 20. | ඩබ්.ඒ.ධර්මසිරි මයා | පොළොන්නරුව |
| 21. | දමයන්ති පරණගම මිය | බදුල්ල |
| 22. | ගුණදාස සමරසිංහ මයා | මොනරාගල |
| 23. | මාලනී ලොකුපෝතාගම මිය | රත්නපුර |
| 24. | මහින්ද එස්. වීරසූරිය මයා | කෑගල්ල |
| 25. | සී.ඒ. සුනෙත් ලෝචන මයා (අති.දි.ලේ.) | හම්බන්තොට |

## වෙනත් අමාත්‍යාංශ/ ආයතන නියෝජනයන්

### මුදල් අමාත්‍යාංශය

1. ආර්.එම්.ටී. රත්නායක මයා - නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්
2. උපුල් ඉන්දික මයා - නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ
3. චතුර මොහොට්ටිගේ මයා - ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

### ජාතික අයවැය දෙපාර්තමේන්තුව

4. එම්.ජේ.එම්. ඉෆ්හාන් මයා - නියෝජ්‍ය අධ්‍යක්ෂ
5. එන්.ආර්.ඩබ්.එන්. කුමාරි මිය - සහකාර අධ්‍යක්ෂ

### භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

6. නිරංගා ප්‍රේමතිලක මිය - අධ්‍යක්ෂ
7. මධූෂා ෆොන්සේකා මිය - නියෝජ්‍ය අධ්‍යක්ෂ

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

8. ඒ.එම්.ආර්.එස්.කේ. අමරකෝන් මයා - අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්
9. එල්.ඒ.එස්. ලියනආරච්චි මයා - ප්‍රධාන ගණකාධිකාරී

### රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

10. ජේ.ජේ. රත්නසිරි මයා - ලේකම්

### ඒකාබද්ධ සේවා අංශය

11. ආලෝක බණ්ඩාර මයා - ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

### තාක්ෂණ අමාත්‍යාංශය

12. ජයන්ත ද සිල්වා මයා - ලේකම්
13. අලවත්ත මයා - අතිරේක ලේකම්

**ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය**

14. රවීන්ද්‍ර පතිරණ මයා - අධ්‍යක්ෂ(යටිතල පහසුකම් හා සේවා)
15. එම්. හේරත් මයා - ප්‍රධාන විධායක නිලධාරි
16. අනුර මයා - ප්‍රධාන නියෝජ්‍ය විධායක නිලධාරි

**පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව**

17. නාමල් කොඩිතුවක්කු මයා - සහකාර සාමාන්‍යාධිකාරී (නියාමන)

**බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව**

18. මේජර් ජනරල් මහින්ද මුදලිගේ මයා - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්

**වනජීවී හා වන සංරක්ෂක අමාත්‍යාංශය**

19. සෝමරත්න විදානපතිරණ මයා - ලේකම්

**වනජීවී හා වන සංරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය**

20. මේජර් ජනරාල් (විශ්‍රාමික) පාලිත ප්‍රනාන්දු මයා - රාජ්‍ය ලේකම්

**වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

21. එම්.ජී.සී සූරිය බණ්ඩාර මයා - අධ්‍යක්ෂ ජනරාල්

**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

22. කේ.එම්.ඒ. බණ්ඩාර මයා - වන සංරක්ෂක ජනරාල්
23. එච්.යූ. ඩයස් මයා - වන සංරක්ෂක

**ප්‍රධාන ලේකම් කාර්යාලය - සබරගමුව**

24. රංජනී ජයකොඩි මිය - ප්‍රධාන ලේකම්

**ඉඩම් අමාත්‍යාංශය**

| | | |
|---|---|---|
| 25. ආර්.ඒ.ඒ.කේ. රණවක මයා | - | ලේකම් |

**ඉඩම් පරිහරණ හා සැලසුම් දෙපාර්තමේන්තුව**

| | | |
|---|---|---|
| 26. ඩබ්.එම්. වනසිංහ මයා | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ |

**ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව** .

| | | |
|---|---|---|
| 27. ජී.ඩී. කීර්ති ගමගේ මයා | - | ඉඩම් කොමසාරිස් ජනරාල් |

**ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව**

| | | |
|---|---|---|
| 28. හේමන්ත කමලසිරි මහතා | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉඩම් - අලෙවි) |

**තක්සේරු දෙපාර්තමේන්තුව**

| | | |
|---|---|---|
| 29. ඩබ්. ක්‍රිස්ටීන් ඊ. පෙරේරා මයා | - | නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරු |

**නාගරික සංවර්ධන අධිකාරිය**

| | | |
|---|---|---|
| 30. එම්.ආර්. රණසිංහ මයා | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් |
| 31. එන්.ජී.එස්.එන්. නිශ්ශංක මයා | - | අධ්‍යක්ෂ (බස්නාහිර පළාත්) |
| 32. ඩබ්.ජී.ආර්. රංජනී මිය | - | සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) |
| 33. එල්.රාජකරුණා මයා | - | සහකාර අධ්‍යක්ෂ (ඉඩම්) |
| 34. රුවන් උදයකුමාර මයා | - | සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) |
| 35. එරන්දික ජයතිස්ස මයා | - | ඉඩම් නිලධාරි |

**මිනින්දෝරු දෙපාර්තමේන්තුව**

| | | |
|---|---|---|
| 36. ජී.ජේ.ටී.එස්. පෙරේරා මිය | - | ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (පළාත්) |

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව**

37. පොල්වත්තගේ මයා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
38. ඩබ්.එස්. චන්දන මයා - ගණකාධිකාරී (ඉඩම්)

**සහාධිපත්‍ය කළමණාකරණ අධිකාරිය**

39. නයනා පැල්පිට මිය - සහකාර සාමාන්‍යාධිකාරී (නියාමන)

**රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය**

40. කේ.යූ. ජයසේකර මයා - නියෝජ්‍ය අධ්‍යක්ෂ

**මාර්ග සංවර්ධන අධිකාරිය**

41. ඩී.එස්.සී.ජේ.ඊ. තන්ත්‍රිමුදලි මයා - නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉඩම්)
42. පී.ආර්.එම්.ඩබ්.ආර්. ඇහැලියගොඩ මයා - පළාත් අධ්‍යක්ෂ

**ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

43. ඩබ්.එම්. ආනන්ද මයා - අතිරේක ලේකම්
44. ඒ.එන්.කේ. වීරසේකර මිය - අධ්‍යක්ෂ

**ජාතික නිවාස සංවර්ධන අධිකාරිය**

45. ආර්.එම්. පියතිස්ස මයා - සහකාර සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති)

**ගොඩනැගිලි දෙපාර්තමේන්තුව**

46. කේ.ජී. සන්ධ්‍යා කුමුදුනී මිය - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු සේවා)

**කර්මාන්ත අමාත්‍යාංශය**

47. අයි. චමින්ද පතිරාජ මයා - අතිරේක ලේකම්
48. යූ.ඒ.සී.එන්. රාජපක්ෂ මයා - සහකාර අධ්‍යක්ෂ (කර්මාන්ත සංවර්ධන)

ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය

49. වී.එච්.එල්. රුද්‍රිගෝ මයා - අතිරේක අධ්‍යක්ෂ

කම්කරු දෙපාර්තමේන්තුව

50. ප්‍රභාත් චන්ද්‍රකීර්ති මයා - කම්කරු කොමසාරිස් ජනරාල්
51. දිලිනි සුමනසේකර මිය - කම්කරු කොමසාරිස්

ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

52. එස්.එච්.ඒ.එන්.ඩී. අභයරත්න මිය - අතිරේක ලේකම් (සංවර්ධන)

අධ්‍යාපන අමාත්‍යාංශය

53. ප්‍රසන්න කිරිවත්තුඩුව මයා - ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්ව විද්‍යාල හා දූරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

54. ඩබ්.ඒ.එස්.ඩබ්. විජේසූරිය මිය - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ

සෞඛ්‍ය අමාත්‍යාංශය

55. සමිත සිරිතුංග මයා - විශේෂඥ වෛද්‍ය

පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

56. රිද්මා බුලත්සිංහල මිය - කොමසාරිස් (මෙහෙයුම්)

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

57. ඩී.ඩී.ජී.ඒ. සෙනෙවිරත්න මයා - සහකාර අධ්‍යක්ෂ ජනරාල්
58. එස්.එච්. මන්සූර් මයා - අධ්‍යක්ෂ (ජන ලේඛන)

### මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

59. ආර්.බී.එම්. අලංක මයා - සහකාර අධ්‍යක්ෂ
60. ඩී.ජී.එච්. පට්ටියවෙල මයා - සහකාර අධ්‍යක්ෂ

### පොලිස් මූලස්ථානය

61. ජගත් අබේසිරිගුණවර්ධන මයා - ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පාලන)

### ආරක්ෂක අමාත්‍යාංශය

62. ජනරාල් කමල් ගුණරත්න මයා (විශ්‍රාමික) - ලේකම්
63. බී.එම්. සමන් දිසානායක මයා - අතිරේක ලේකම්

### වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

64. තරංගනී වික්‍රමසිංහ මිය - අතිරේක ලේකම්
65. ඩබ්.ඒ.එස්. ඉරෝෂන් මයා - නියෝජ්‍ය අධ්‍යක්ෂ
66. ආර්.එම්.ජී.සී. ජයරත්න මයා - සහකාර අධ්‍යක්ෂ

### පරිසර අමාත්‍යාංශය

67. ඩබ්.ටී.බී. දිසානායක මයා - අතිරේක ලේකම්

### වාරිමාර්ග දෙපාර්තමේන්තුව

68. බී.ඒ සම්පත් මයා - වාරිමාර්ග ඉංජිනේරු

### ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

69. ජේ.එම්.අයි.එච්. ජයවර්ධන මිය - අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ සැලසුම්)
70. එස්.ඒ.ඊ.ඩබ්. කුලරත්න මිය - අධ්‍යක්ෂ (ඉඩම්)

### මැතිවරණ කොමිෂන් සභාව

71. සමන් ශ්‍රී රත්නායක මයා - කොමසාරිස් ජනරාල්

සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

72. සී.ඩී. කළුආරච්චි මයා - අතිරේක ලේකම්

සමාජ සේවා දෙපාර්තමේන්තුව

73. චන්දන රණවීර ආරච්චි මයා - අධ්‍යක්ෂ

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

74. එම්.ඒ.එම්. අරීෆා මිය - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්

රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳව මහ ලේකම් කාර්යාලය

75. රාජා ගුණරත්න මයා - අධ්‍යක්ෂ ජනරාල්

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

76. ඩබ්.එම්.ඩබ්. වීරකෝන් මයා - අධ්‍යක්ෂ ජනරාල්

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

77. ප්‍රේමචන්ද්‍ර ඇපා මයා - සභාපති
78. එම්.එම්.සී. මන්තිලක මෙය - අධ්‍යක්ෂ (රක්ෂණ)

නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය

79. ඩබ්.එම්.ආර්.බී. වීරසේකර මයා - අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රමසම්පාදන)

## ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන්

| | | |
|---|---|---|
| 1. | එන්.එච්.එම්. චිත්‍රානන්ද මයා | රාජ්‍ය ලේකම් |
| 2. | කේ.ජී.ධර්මතිලක මයා | අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු) |
| 3. | කේ.ජී. විජේසිරි මයා | අතිරේක ලේකම් (පාලන) |
| 4. | ඩබ්.එම්.ඒ.පී.බී.වන්නිනායක මයා | අතිරේක ලේකම් (සංවර්ධන) |
| 5. | වරුණ ශ්‍රී ධනපාල මහතා | අතිරේක ලේකම් (ප්‍රාදේශීය පාලන ප්‍රතිසංස්කරණ) |
| 6. | ධම්මික මුතුගල මහතා | අතිරේක ලේකම් (විමර්ශන) |
| 7. | තාරක ලියනපතිරණ මයා | ප්‍රධාන මූල්‍ය නිලධාරී |
| 8. | ඩී.එම්. නන්දාවතී මිය | අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රමසම්පාදන) |
| 9. | එම්.ජී.එන්. දිල්රුක්ෂි මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (දිස්ත්‍රික් පාලන) |
| 10. | ඩබ්.පී.සී.ඒ.වීරසූරිය මයා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ප්‍රාදේශීය පාලන) |
| 11. | කේ.ඩී. බන්දුල ජයසිංහ මයා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ග්‍රාම නිලධාරී පාලන) |
| 12. | ඒ.බී.ඩබ්.කුමාරසිංහ මයා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) |
| 13. | එන්. වසන්ත ආරියරත්න මයා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (විමර්ශන) |
| 14. | කේ.ඩී.සී.එස්. කුමාරතුංග මයා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සංවර්ධන) |
| 15. | කේ.ඒ.ඩී.වසන්ත කුමාර මයා | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| 16. | ඩබ්.ඒ.ඩී.පී. විජේසිංහ මයා | ගණකාධිකාරී (ගෙවීම්) |
| 17. | කේ.සී. කරුණාරත්න මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| 18. | නිකේෂලා අබේගුණසේකර මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) |
| 19. | පී.ආර්.එම්.ඩී.එන්. බඹරදෙණිය මයා | සහකාර ලේකම්(සංවර්ධන) |
| 20. | ජී.කේ.එම්.පී. කුමාර මයා | සහකාර ලේකම් (විමර්ශන) |
| 21. | ටී.එම්. සාලිකා ඒකනායක මෙය | සහකාර ලේකම් (දිස්ත්‍රික් පාලන) |
| 22. | ඩබ්.කේ.බී.ඒ.එස්. පරාක්‍රම මයා | සහකාර ලේකම් (ප්‍රාදේශීය පාලන) |
| 23. | එම්.ඩී.එල්.එන්.ගුණතිලක මයා | සහකාර ලේකම් (ග්‍රාම නිලධාරී පාලන) |
| 24. | එස්. සුරේන්ද්‍රන් මයා | සහකාර ලේකම් (පාලන) |
| 25. | එන්.සී. ජයරත්න මයා | සහකාර ලේකම් (පාලන) |
| 26. | ඩී.එම්.ආර්.කේ. දිසානායක මයා | අභ්‍යන්තර විගණක |
| 27. | ටී.එස්. පල්ලියගුරුගේ මෙය | නීති නිලධාරී |
| 28. | ආර්. පුෂ්පා රංජනී මිය | සම්බන්ධීකරණ ලේකම් |

## 01. ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් එන්.එච්.එම්. චිත්‍රානන්ද මහතා

1. ලේකම්තුමන් විසින් නව පත්වීම් ලද නුවරඑළිය දිස්ත්‍රික් ලේකම්තුමා ඇතුළු සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ දිස්ත්‍රික් ලේකම් සමුළුව සඳහා පැමිණ සිටි සියලුම නිලධාරීන් සාදරයෙන් පිළිගන්නා ලදී.

2. ජනාධිපති ලේකම් කාර්යාලයේ පැවැත්වූ රැස්වීම්වලදී අවධානය යොමු කළ පහත කරුණු පිළිබඳව ලේකම්තුමා විසින් දිස්ත්‍රික් ලේකම්වරුන් දැනුවත් කරන ලදී.

    - ශ්‍රී ලංකාව තුළ දරිද්‍රතාවයෙන් පෙළෙන ජනතාව 70% ක් පමණ වන අතර 35% කට වැඩි පිරිසක් කෘෂි නිෂ්පාදනය මත ජීවත් වීමත් ඉන් තවත් කොටසක් කෘෂි කර්මාන්තය හා බැඳි ජීවනෝපායවල නියුක්ත වීම.
    - කිරි නිෂ්පාදනය, ධීවර කර්මාන්තය, වැව්ලි කර්මාන්තය, එළවළු-පලතුරු හා ධාන්‍ය වර්ග නිෂ්පාදනය වර්ධනය කිරීම මේ සඳහා පොහොර, ජලය, බීජ වර්ග හා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.
    - ග්‍රාමීය වශයෙන් ප්‍රතිසංස්කරණය කළ යුතු වැව් හඳුනාගැනීම හා ඒවා දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ අධීක්ෂණය යටතේ ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කිරීම.
    - පස, කාලගුණය, වර්ෂාව ආදී කරුණු සලකා බලා ඉඩම් පාරිභෝජන රටාවක් හඳුනාගෙන ඒ ඒ කලාප වල වගා කිරීමට, වඩාත් ගැලපෙන භෝගය තීරණය කිරීම.
    - පාරම්පරික හේන් ගොවිතැන පිළිබඳ ඇති ගැටළුකාරී තත්වයන් පිළිබඳව සලකා බැලීම
    - වන විනාශය සම්බන්ධව සමාජයේ පවතින බරපතළ විවේචන සම්බන්ධ සොයා බැලීම හා එවැනි වන විනාශයන් සිදුවන්නේද යන්න දිසාපතිවරු විසින් සොයා බැලිය යුතු බව.
    - කැලෑ වරද දෙසති වාර්තාව, ග්‍රාම නිලධාරීන්ගෙන් අනිවාර්යෙන්ම ලබා ගැනීම හා ඊට අදාළව අධිකරණ ක්‍රියා මාර්ග ගැනීම.
    - එළවළු ගොවියා හා පාරිභෝගිකයා අතර පවතින මිල විෂමතාව අවම කිරීමට කටයුතු කළ යුතු බව
    - විදුලිය නොමැති නිවාස පිළිබඳ තොරතුරු ලබාගෙන එම නිවාස සඳහා හැකි ඉක්මනින් විදුලිය ලබා දීමට කටයුතු කළ යුතු බව

3. ගම් මට්ටමින් පවතින ප්‍රතිසංස්කරණය කළ යුතු වැව් සඳහා ලක්ෂ 5 – 10 අතර ප්‍රමාණයක ප්‍රතිපාදන ලබා දිය හැකි බවත් ඒ අනුව ප්‍රතිසංස්කරණය කළ යුතු වැව් හඳුනාගෙන අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස දිස්ත්‍රික් ලේකම්වරුන් දැනුවත් කරනු ලැබීය.

## 02. ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු චමල් රාජපක්ෂ මැතිතුමා

| ගැටලුව/ කරුණ | සාකච්ඡා කළ කරුණු/ ගන්නා ලද තීරණ | වගකීම |
|---|---|---|
| සෑම දිස්ත්‍රික්කයම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආශ්‍රිතව ඉඩම් ගැටළු බොහොමයක් පවතින බැවින් එම කාර්යාලවල පරිපාලන කටයුතු පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතු බව දන්වන ලදී. | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |
| දිස්ත්‍රික්කයේ ඉඩම් බලතල දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස දන්වන ලදී | | ඉඩම් අමාත්‍යාංශය |
| එමෙන්ම යම් යම් කාර්යයන් ඉටු කිරීමේදී ආකෘති පත්‍ර පිරවිය යුතු බවත් එම ප්‍රමාණය අවම වන ආකාරයේ ආකෘති පත්‍ර සරල කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම පිළිබඳව අවධානය යොමු කළ යුතු බව දන්වන ලදී | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |
| ඉඩම් ගැටළු විසඳීමේදී යම් බාධාවක් මතුවේ නම් ඒවා අමාත්‍ය මණ්ඩල අනු කමිටු හරහා විසඳා ගැනීමේ හැකියාවක් ඇති බව අවධාරණය කරන ලදී | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |
| රජයේ කාර්යාල සඳහා පැමිණෙන මහජනතාවට සුහදශීලී සේවාවක් සැපයීම හා නිලධාරීන්ගේ විනය පවත්වාගෙන යාම පිළිබඳව සැලකිලිමත් විය යුතු බව දන්වන ලදී | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |
| ග්‍රාම නිලධාරීන් නිරන්තරයෙන් දේශපාලන අධිකාරිය සමඟ ගැටීම් ඇති කර ගන්නා බවත් එවැනි අවස්ථා ඇති නොවීමට ඔවුන් දැනුවත් කරන ලෙසත් දන්වන ලදී | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |
| ඇතැම් අවස්ථාවලදී පොලීසියද ජාවාරම්කරුවන් සමඟ සම්බන්ධ වී මත්ද්‍රව්‍ය ජාවාරම් සිදු කරනු ලබන අවස්ථා ඇති හෙයින් ඒ සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් මැදිහත්වී කටයුතු කරන ලෙස අවධාරණය කරන ලදී. | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |
| වන විනාශය සම්බන්ධයෙන් ප්‍රචාරය වන සාවද්‍ය ප්‍රකාශ නිසා ගැටළු ඇති වන බවත් ඒවා නිවැරදි කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව මාධ්‍ය වෙත අදහස් දැක්වීමට දිස්ත්‍රික් ලේකම්වරුන්ට හැකියාවක් නොමැති නිසා මෙම සාවද්‍ය ප්‍රකාශ මඟින් දිස්ත්‍රික් ලේකම්වරුන් අපහසුතාවට පත්වන බව නිරීක්ෂණය වන බැවින් මෙවැනි | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |

| | | |
|---|---|---|
| අවස්ථාවල අමාත්‍යාංශයේ මාධ්‍ය අංශයේ කටයුතු කරන කසුන් වීරතුංග මහතා (දු.අං. 071 3935936) සම්බන්ධ කර ගන්නා ලෙස දන්වන ලදී. | | |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පවතින වාහන හිඟතාව පිළිබඳ ඉදිරියේදී පියවර ගැනීමට කටයුතු යොදන ලෙස දන්වන ලදී. | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් ස්වදේශ කටයුතු අතිරේක ලේකම් (පාලන අංශය) |

<u>දිස්ත්‍රික් ලේකම් සමුළුවේ සාකච්ඡා කළ කරුණු සහ එළඹි තීරණ</u>

| ගැටලුව/ කරුණ | සාකච්ඡා කළ කරුණු/ ගන්නා ලද තීරණ | වගකීම |
|---|---|---|
| 03. <u>මුදල් අමාත්‍යාංශය/ ජාතික අයවැය දෙපාර්තමේන්තුව/ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව/ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව</u> | | |

අඩු ආදායම්ලාභී දත්ත පද්ධතිය හඳුන්වාදීම හා එය ස්ථාපිත කිරීමේ ඉදිරි වැඩපිළිවෙල පිළිබඳව සාකච්ඡා කිරීම (සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය සහ සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය)

| ගැටලුව/ කරුණ | සාකච්ඡා කළ කරුණු/ ගන්නා ලද තීරණ | වගකීම |
|---|---|---|
| අඩු ආදායම්ලාභීන් පිළිබඳව තොරතුරු ලබා ගැනීම සඳහා දත්ත පද්ධතියක අවශ්‍යතාව හඳුනාගැනීමෙන් පසු ඒකාබද්ධ සුභසාධන තොරතුරු දත්ත පද්ධතියක් සකස් කිරීමට මුදල් අමාත්‍යාංශය තීරණය කළ බව දන්වන ලදී | | මුදල් අමාත්‍යාංශය |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ග්‍රාම නිලධාරී, ආර්ථික සංවර්ධන නිලධාරී, යන නිලධාරීන්ගෙන් මෙම තොරතුරු රැස්කිරීමට අපේක්ෂිත බවත් ඒ සඳහා අවශ්‍ය උපාංග (Tablet) ලබා දීමට කටයුතු කරන බවත් දැන්විය. | | මුදල් අමාත්‍යාංශය |
| ප්‍රායෝගිකව මෙම දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම්වලදී ගැටළු මතුවිය හැකි බවත් මෙම දත්ත එක්රැස් කර ගැනීම මඟින් විශාල ප්‍රතිලාභයක් අත්වන බවත් ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙසත් දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටින ලදී. | | මුදල් අමාත්‍යාංශය සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |

| | | |
|---|---|---|
| මේ සඳහා දැනුම සහිත නිලධාරීන් සම්බන්ධ කරන ලෙස සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටි අතර දෙසැම්බර් මාසය වනවිට මෙම දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමේ කටයුතු අවසන් කිරීමට බලාපොරොත්තු වන බව දන්වන ලදී. | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |
| "පිබිදෙමු පොළොන්නරුව" දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහනෙහි ඇතැම් බිල්පත් පියවීම සඳහා ප්‍රතිපාදන ලබා ගැනීම. (පොළොන්නරුව දි.ලේ)<br><br>2019 හා 2020 වර්ෂයේ ඇතැම් බිල්පත් ගෙවීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන හා අක්මුදල් නොලැබීම. (පුත්තලම දි.ලේ) | මෙම බිල්පත් ඉදිරියේදී ප්‍රතිපූර්ණය කිරීමට පියවර ගන්නා බව දැන්වීය.<br><br>අනෙකුත් දිස්ත්‍රික්කයන්හි එක් එක් සංවර්ධන වැඩසටහන්හි පවතින ඇතැම් බිල්පත් පියවීම සඳහා ප්‍රතිපාදන ලබා දීම සම්බන්ධයෙන් ඉදිරියේදී දිනයක් ලබා දී ඒ පිළිබඳ සාකච්ඡා කිරීමට අවස්ථාවක් ලබා දෙන ලෙස දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ඉල්ලීමක් කරන ලදී. | ජාතික අයවැය දෙපාර්තමේන්තුව |
| අයවැය චක්‍රලේඛ 2/2014 යටතේ ක්ෂේත්‍ර රාජකාරිවල නිරත යතුරුපැදි ලබාගත් නිලධාරීන් අතරින් සේවය අතහැර ගිය නිලධාරීන් විසින් චක්‍රලේඛ උපදෙස් පරිදි මුදල් නොගෙවීම මත නීතිමය ක්‍රියා මාර්ග ගැනීමේ අපහසුව මෙන්ම යතුරුපැදි ප්‍රාදේශීය ලේකම්ගේ භාරයට ගැනීමේ අපහසුතාව සම්බන්ධව (පුත්තලම දි.ලේ) | වෙනත් රජයේ තනතුරු සඳහා මුදාහැරීම් කළ නිලධාරීන්ගෙන් හා සේවය අතහැර ගිය නිලධාරීන්ගෙන් එම වටිනාකම නැවත අයකර ගැනීමට කටයුතු කරන බව දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් අදහස් දැක්වූ අතර මෙම අයකර ගැනීම් සම්බන්ධව නීතිමය පදනමක් නොමැති බැවින් සාකච්ඡා කර ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වන ලදී. | ජාතික අයවැය දෙපාර්තමේන්තුව |
| සපිරි ගමක්, RIDP සහ පෝෂණ දීමනා 2020 ඇතැම් බිල්පත් ගෙවීම් කිරීම සඳහා අක්මුදල් නොමැති වීම. (කුරුණෑගල දි.ලේ) | මේ වනවිට බිල්පත් ගෙවීම සඳහා අක්මුදල් ලැබී ඇති බව දිස්ත්‍රික් ලේකම් විසින් දන්වන ලදී. | |
| ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන නිදහස් නොකිරීම නිසා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 2021 කාල රාමුව සකස් කිරීමේ දුෂ්කරතා ඇතිවීම. (යාපනය දි.ලේ) | මුදල් අමාත්‍යාංශයක් සමඟ සාකච්ඡා කර අවශ්‍ය කටයුතු සිදු කිරීමට පියවර ගන්නා බව දැන්වීය. | ජාතික අයවැය දෙපාර්තමේන්තුව |

| | | |
|---|---|---|
| ගොඩනැගිලි අලුත්වැඩියාව සඳහා 269-1-1-0-2001 වැය ශීර්ෂය යටතේ අමතර ප්‍රතිපාදනයක් ඉල්ලුම් කිරීම සම්බන්ධව (මඩකලපුව දි.ලේ) | මේ වර්ෂය තුළ ගෙවීම් කිරීමට කටයුතු කරන බව දන්න ලදී. | ජාතික අයවැය දෙපාර්තමේන්තුව |
| දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමාගේ නිල රථය අලුත්වැඩියා කිරීම සම්බන්ධව ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් අවසර ලැබී ඇතිමුත් ප්‍රතිපාදන නොලැබීම සම්බන්ධව (වවුනියාව දි.ලේ) | වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන අලුත්වැඩියාවට දැනට ලක්ෂ 25ක ප්‍රමාණයක් වියදම් කර ඇති බවත් තවත් ලක්ෂ 17 ක ප්‍රමාණයක් අවශ්‍ය බවත් දිස්ත්‍රික් ලේකම් විසින් දන්වන ලදී.<br><br>එසේම මේ සඳහා වෙනම ප්‍රතිපාදනයක් ලබා දීම සුදුසු බව හෝ එසේ නොමැති නම් පරිපාලන වියදම් වැඩි කිරීම සම්බන්ධව ක්‍රියාමාර්ග ගත යුතු බවත් දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් යෝජනා කරන ලදී.<br><br>දැනට තිබෙන ප්‍රතිපාදනවලින් මෙම කටයුතු සිදු කරගන්නා ලෙස දැන්වූ නමුත් එලෙස සිදු කිරීම අපහසු බැවින් මෙවැනි ඉල්ලීම් අමාත්‍යාංශය වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස අමාත්‍යාංශ ලේකම් තුමා විසින් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත දන්වන ලදී. | ජාතික අයවැය දෙපාර්තමේන්තුව<br><br>මුදල් අමාත්‍යාංශය |
| 2021 වර්ෂයට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි රෙජිස්ට්‍රාර් අංශයන්හි කාර්යාලයීය අවශ්‍යතා සඳහා අඩුපාඩු පැවතීම සම්බන්ධව (කුරුණෑගල දි.ලේ) | මේ පිළිබඳව ඉදිරියේදී අවශ්‍ය පියවර ගන්නා බව දන්වන ලදී. | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව |
| නිල සෙවණ කාර්යාල ඉදිකිරීම සම්බන්ධ ගැටළුව (සංවර්ධන අංශය) තිබෙන කාර්යාල සඳහා යටිතල පහසුකම් සැපයීම හා කාර්යාල අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් මෙම වර්ෂය තුළ පවතින මුදල් සීමා සහිත බවත් ඉදිකිරීමට නියමිත නිල සෙවණ කාර්යාල සඳහා ප්‍රතිපාදන අවශ්‍ය බවත් දන්වන ලදී. | දැනට ලැබී ඇති ඉල්ලීම් අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු බවත් නිල සෙවණ කාර්යාල ඉදිරි අවශ්‍යතාව පිළිබඳව සංවර්ධන අංශයෙන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සකසා ඉදිරිපත් කරන ලෙස දැන්විය. | ජාතික අයවැය දෙපාර්තමේන්තුව<br><br>සංවර්ධන අංශය |

**04. රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය/ඒකාබද්ධ සේවා අංශය/ තාක්ෂණ අමාත්‍යාංශය/ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය/ සංචාරක මණ්ඩලය/ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව/ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව/ බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව/ ප්‍රධාන ලේකම් කාර්යාලය - සබරගමුව**

| | | |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක පවතින ගණකාධිකාරී පුරප්පාඩු සම්බන්ධව (පුත්තලම දි.ලේ) | ඉතා ඉක්මනින් මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බව සඳහන් කරන ලදී. | රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය |
| ලංකා රාජ්‍ය ජාලයේ (LGN) නව සේවා ගිවිසුම් සම්පාදනයේදී අලුතින් නිර්මාණය කරන ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා සේවා සැපයීම සම්බන්ධව (ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ අංශය) | මැයි මාසයේ මුල් දිනවල මෙම කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වන බව දන්වා සිටින ලදී. ප්‍රාදේශීය කාර්යාලවල පවතින LGN පද්ධති වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාව කඩිනමින් ඉදිරිපත් කරල ලෙස ප්‍රාදේශීය පාලන ප්‍රතිසංස්කරණ අංශය වෙත දන්වා සිටින ලදී. | තාක්ෂණ අමාත්‍යාංශය |
| තාක්ෂණ අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් පිහිටුවීමට යෝජිත (Technology Park) සඳහා අවශ්‍ය ඉඩම් ඇතුළු සෙසු අවශ්‍යතා සපුරාලීම. (ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ අංශය) | Technology Park සඳහා අවශ්‍ය ඉඩම් දැනට දිස්ත්‍රික්ක 05 ක් මඟින් ලබා දී ඇති බවත් මේ සඳහා මුහුදුබඩ ප්‍රදේශයක්ද අවශ්‍ය බැවින් ඒ සම්බන්ධයෙන් අක්කර 25 ක පමණ ඉඩම් ප්‍රමාණයක් ලබා දිය හැකි දිස්ත්‍රික් ලේකම්වරුයෙකු සිටී නම් දැනුවත් කරන ලෙස දන්වන ලදී.<br><br>මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සියලු දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සහය බලාපොරොත්තු වන බව දන්වන ලදී.<br><br>ඩිජිටල් හැඳුනුම්පත සකස් කිරීම සම්බන්ධයෙන්ද අදහස් දක්වන ලදී. | තාක්ෂණ අමාත්‍යාංශය<br><br>සියලුම දිස්ත්‍රික් ලේකම්වරු |

රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්තුමා විසින් සාකච්ඡා කරන ලද කරුණු:-

| ගැටලුව/ කරුණ | සාකච්ඡා කළ කරුණු/ ගන්නා ලද තීරණ | වගකීම |
|---|---|---|
| රාජ්‍ය සේවය තුළ සම්බන්ධීකරණ කටයුතුවල දුර්වලතා නිසා මහජනතාවගෙන් චෝදනා එල්ල වන බවත් මෙම චෝදනා එල්ලවීම් මඟ හරවා ගැනීම සඳහා කාර්යාලවල ප්‍රධාන නිලධාරීන්ගේ ආකල්පමය වෙනසක් ඇති කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අරමුණු කරගෙන පළාත් වශයෙන් සැසි 09 ක් පැවැත්වීමට කටයුතු සිදු කරන බවත් රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්තුමා විසින් කරුණු දක්වන ලදී. | | රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා පුහුණු වැඩසටහන් වෙනුවෙන් මුදල් ලබා දීමේ හැකියාවක් පවතින බවත් දිස්ත්‍රික්ක මට්ටමින් අත්‍යවශ්‍ය පුහුණු වැඩසටහන් ඉදිරිපත් කරන ලෙසත් දැන්විය. | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්<br>රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විගණන කටයුතු සිදුකිරීමේදී ඒ වෙනුවෙන් තනතුරු අනුමත කර ගැනීම් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කළ හැකි බවත් මෙම විගණනය සඳහා විශේෂ දැනුමක් ඇති නිලධාරීන් යොදා ගන්නා ලෙසත් දන්වන ලදී. | | රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය<br>සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |
| 2019 බඳවාගත් උපාධිධාරීන් 14,500 කට ආසන්න ප්‍රමාණයකගේ ස්ථිර පත්වීම් ලබා දුන් බවත් එහි ගැටළු පවතී නම් ඒවා ඉදිරිපත් කරන ලෙසත් දන්වන ලදී. | | රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය<br>සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |
| අනුමත කාර්ය මණ්ඩලයෙන් පිට නිලධාරීන් අනුයුක්ත කර ඇති බව දිස්ත්‍රික් ලේකම්වරුන් දන්වන ලදී. | | රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය<br>සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |

වනජීවී අමාත්‍යාංශ ලේකම්තුමා විසින් සාකච්ඡා කරන ලද කරුණු:-

| ගැටලුව/ කරුණ | සාකච්ඡා කළ කරුණු/ ගන්නා ලද තීරණ | වගකීම |
|---|---|---|
| එක් එක් දිස්ත්‍රික්කවල ඉඩම් අනවසර අල්ලා ගැනීම් හෙක්ටයාර 62,000 ප්‍රාදේශීය ලේකම් වෙත නිදහස් කිරීමට එකඟ වන බව දැන්වීය. මින් අක්කර 6,000ක ප්‍රමාණය යම් යම් ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් භාර දීම හා භාර ගැනීම සිදු කර ඇති බව දන්වන ලදී. | | ඉඩම් අමාත්‍යාංශය |
| කැලෑ කැපීම්වලදී ගනු ලබන ගුවන් ඡායාරූප ගුවන් හමුදාව විසින් ඉදිරිපත් කරන බවත් ඒ සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම්වරුන් දැනුවත් කළ පසු සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස දන්වන ලදී. | | ඉඩම් අමාත්‍යාංශය<br><br>සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |

ඉඩම් අමාත්‍යාංශ ලේකම්තුමා විසින් සාකච්ඡා කරන ලද කරුණු:-

| ගැටලුව/ කරුණ | සාකච්ඡා කළ කරුණු/ ගන්නා ලද තීරණ | වගකීම |
|---|---|---|
| අනවසර අල්ලා ගැනීම් කරන ලද ඉඩම් භාරගැනීම් කර ඉඩම් නිරවුල් කිරීමේ වගකීමද දිස්ත්‍රික් ලේකම්වරුන් සතුවන බව දන්වන ලදී. | | ඉඩම් අමාත්‍යාංශය<br><br>සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |
| ඉඩම් විශාල ප්‍රමාණයක් අනවසර ලෙස අල්ලාගෙන භුක්ති විඳින පිරිසකුත් සිටින බැවින් මෙම කටයුතු නැවැත්වීමේ අරමුණ සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සහය පතන ලදී. | | ඉඩම් අමාත්‍යාංශය<br><br>සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |

| | | |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ඉඩම් බලතල ලබාදීමට කඩිනමින් කටයුතු කළයුතු බව දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් අවධාරණය කරන ලදී. | | ඉඩම් අමාත්‍යාංශය<br><br>සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |

බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන ලද ඉදිරිපත් කිරීම

| ගැටලුව/ කරුණ | සාකච්ඡා කළ කරුණු/ ගන්නා ලද තීරණ | වගකීම |
|---|---|---|
| බඳවාගැනීම් කටයුතු සම්බන්ධව -<br>දැනට තීරණය කර ඇති සියලු පත්වීම් ලබා දිය යුතු බව ජනාධිපතිතුමා විසින් ප්‍රකාශ කර සිටි බව හා ආබාධිත පුද්ගලයින් සඳහා ලබා දිය යුතු රැකියාව කුමක්ද යන්න පිළිබඳ ගැටළුවක් පවතින බව දන්වන ලදී. | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්<br><br>බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව |
| වැටුප් ලබාගෙන දීර්ඝ කාලීනව නොපැමිණෙන අය සේවය අතහැර ගියා සේ සලකා කටයුතු කළ යුතු බව දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් අවධාරණය කර සිටින ලදී. | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්<br><br>බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව |
| පළාත්/ දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිටින සංවර්ධන නිලධාරින්ගේ කාර්ය සාධන ඇගයීම් වාර්තාව පිළිබඳව තීරණ ලබා ගැනීම සම්බන්ධයෙන් සහකාර අධ්‍යක්ෂ හෝ ප්‍රාදේශීය මට්ටමින් ප්‍රමාණකරු වන ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් සිදු කළ යුතුය. | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |
| මියයෑම්/ දරු ප්‍රසූතිය සහ තුවාල සිදුවූ අය පිළිබඳව තීරණ ලබා ගැනීම<br><br>- රාජකාරියේදී සිදුවූ හානි සඳහා | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |

| | | | |
|---|---|---|---|
| | වෛද්‍ය පරීක්ෂණ වාර්තා සලකා බලා ගෙවීම් කිරීම කළ හැකි බවත් දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් දන්වන ලදී.<br><br>- දරු ප්‍රසූතිය සඳහා නියමිත නිවාඩු ප්‍රමාණය දින 42 තුළ වැටුප් ගෙවීම් කරන බවත් ඉන් ඔබ්බට නිවාඩු ගන්නේ නම් ඒ සඳහා වැටුප් ගෙවීම් නොකරන ලෙසත් එසේ ලබාගත් නිවාඩු කාලසීමාවට සමාන කාලයකින් පුහුණු කාලය දීර්ඝ කළ යුතු බව දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් දන්වන ලදී. | | |
| | පළාත් අධ්‍යක්ෂවරුන්ගේ කාර්යාල පවත්වාගෙන යාම සඳහා ස්ථානයක් වෙන් කරවා ගැනීම සම්බන්ධව සියලු දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සහය පතන ලදී. | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |

05. <u>රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය/ මාර්ග සංවර්ධන අධිකාරිය/ ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය/ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය/ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව</u>

| | | |
|---|---|---|
| වැලිකන්ද කොට්ඨාසයේ ආපදා සහන සේවා, පානීය ජලය බෙදාහැරීමේ රාජකාරීවල නියුතු සේවයකයන් සඳහා දීමනා ගෙවීමට ප්‍රතිපාදන නොලැබීම (පොළොන්නරුව දි.ලේ) | මේ වනවිට සාකච්ඡා මට්ටමේ පවතින බැවින් ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු කරන බැව් දන්වන ලදී. | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව |

| | | |
|---|---|---|
| තමන්කඩුව මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා මෙතෙක් තක්සේරු වාර්තා ලැබී ඇති ඉඩම් කැබලි සඳහා වන්දි ගෙවීම සම්බන්ධව (පොළොන්නරුව දි.ලේ) | මුදල් ලැබුණු වහාම වන්දි ගෙවීමට කටයුතු කරන බව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් දන්වා සිටින ලදී | මාර්ග සංවර්ධන අධිකාරිය |
| ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක "ඔබට ගෙයක් - රටට හෙටක්" ජාතික වැඩසටහනේ ප්‍රතිලාභින් තෝරාගැනීමේ නිර්ණායකයෙහි වෙනස්කම් කළයුතු වීම (කොළඹ දි.ලේ) | නිවසකින් කොටසක් හෝ ගොඩනගා ගත් පුද්ගලයින්ට අසාධාරණයක් සිදුවන බැවින් දැනට තිබෙන නිර්ණායක වෙනස් කිරීමක් සිදු කිරීම කළ හැකි නම් වඩා සුදුසු වනු බව කොළඹ දිස්ත්‍රික් ලේකම් විසින් ප්‍රකාශ කර සිටි අතර මෙසේ නිර්ණායක වෙනස් කිරීමක් සිදු කළ නොහැකි බවත් එවැනි පුද්ගලයින්ට "සෙවන" අරමුදල යටතේ රු. 500,000 ආධාර හා "ඔබට ගෙයක්" වැඩසටහන යටතේ රු. 600,000ක ආධාර මුදලක් ලබා දීමේ හැකියාවක් පවතින බව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් දන්වා සිටින ලදී. | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය |
| **06. <u>නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය/ඉඩම් පරිහරණ හා සැළසුම් දෙපාර්තමේන්තුව/ ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව/ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව/ තක්සේරු දෙපාර්තමේන්තුව/ නාගරික සංවර්ධන අධිකාරිය/ මිනින්දෝරු දෙපාර්තමේන්තුව/ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව/ සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය</u>** | | |
| අනුරාධපුරය, අම්පාර, ත්‍රිකුණාමලය, මඩකළපුව දිස්ත්‍රික්කයන්හි සංස්ථාව විසින් භුක්ති විඳිනු ලබන රජය සතු ඉඩම් සංස්ථාව වෙත පවරා ගැනීම (ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව) | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුවේදී සාකච්ඡා කර තීරණ ගත යුතු බැවින් එක් එක් දිස්ත්‍රික්කයන්ට අදාළව සංස්ථාව විසින් භුක්ති විඳින ඉඩම් ලැයිස්තුව දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ඉදිරිපත් කරන ලෙස දන්වන ලදී. | ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව |
| කටුකැලියාව පිහිටි සංස්ථා සංචාරක නිවාසයට යාබදව පෙරමියන්කුලම වැව් රක්ෂිතය තුළ අනවසර ඉදිකිරීම | මහේස්ත්‍රාත් තීන්දුව ලැබී ඇති බවත් මෙම අනවසර ඉදි කිරීම ඉවත් කිරීමට කඩිනමින් පියවර ගන්නා බවත් දන්වන ලදී. | ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව |

| | | |
|---|---|---|
| 2018 අංක 23 දරණ බද්ධ නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන) පනත යටතේ පැවරී ඇති බලතල අනුව සුනාමි සහාධිපත්‍ය දේපල සඳහා මේ වන තෙක් ඔප්පු ලබා දීමට නොහැකි වීම හා එම කටයුත්ත ඉටු කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද වීම | මේ වන විටත් ඔප්පු ලබා නොදුන් කොළඹ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට ඇතුළු දිස්ත්‍රික්ක 08 ක සහාධිපත්‍ය දේපල ඇති බවත් ඔප්පු ලබා දීමේදී ඒ සඳහා අවශ්‍යවන සහාධිපත්‍ය සහතිකය ලබා ගැනීමට 2018 අංක 23 දරණ බද්ධ නිවාස අයිතිකම් පනත මඟින් ලිහිල් කිරීමක් කර ඇති බවත් පදිංචිය ආරක්ෂිතය යන්න සනාථ කරමින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ සහතිකය සහ මිනින්දෝරුවෙකු මඟින් සකස් කරන ලද සහාධිපත්‍ය පිඹුරුපත යන ලියවිලි දෙවර්ගය පමණක් මේ සහාධිපත්‍ය සහතිකය නිකුත් කිරීම සඳහා අවශ්‍ය වන බවත් දන්වන ලදී.<br><br>පනතේ වලංගු කාලය අවුරුදු 05 ක් වන බවත් මෙම කටයුතු සිදු කර ගැනීමට ඇත්තේ තවත් අවුරුදු 02 ක පමණ කාලයක් වන බැවින් කඩිනමින් මෙම කාර්යයන් අවසන් කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස සහකාර සාමාන්‍යාධිකාරිතුමිය විසින් දන්වන ලදී | සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය<br><br>සියලුම දිස්ත්‍රික් ලේකම්වරු |

<u>නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයෙන් ඉදිරිපත් කරන ලද ගැටළු:</u>

| ගැටලුව/ කරුණ | සාකච්ඡා කළ කරුණු/ ගන්නා ලද තීරණ | වගකීම |
|---|---|---|
| කොළඹ 07 පිහිටි 60 වත්ත (හැවේ වත්ත) නමැති ඉඩම අත්කර ගැනීම සඳහා තක්සේරු නිලධාරින්ට ඉඩමට ඇතුළත් වීමට පදිංචිකරුවන් ඉඩ නොදී සිටි ඉඩම, මේ වනවිට අත්පත් කර ගැනීම සිදු කර ඇති බව දන්වා සිටින ලදී. | | දිස්ත්‍රික් ලේකම් කොළඹ |

| | | | |
|---|---|---|---|
| | බදුල්ල සංවර්ධනය සඳහා අත්පත් කරගත් "තැපැල්හල පාරේ" පිහිටි ඉඩමේ වන්දි තක්සේරු කිරීමේ පදනම සම්බන්ධයෙන් පවතින ගැටළුව සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ මතය, සංශෝධනය කරගැනීමට මේ වනවිටයොමු කර තිබෙන බවත් වන්දි තක්සේරු කිරීමේ කටයුතු කඩිනම් කළ යුතු බව නාගරික සංවර්ධන විසින් දන්වන ලද අතර එකී ප්‍රගතිය අමාත්‍යාංශය වෙත ලබා දෙන ලෙස බදුල්ල දිස්ත්‍රික් ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. | | දිස්ත්‍රික් ලේකම් බදුල්ල<br><br>නාගරික සංවර්ධන අධිකාරිය |
| | බදුල්ල බණ්ඩාරවෙල නගර මධ්‍යයන්හි ඌණ භාවිතයේ පවතින දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් ප්‍රශස්ත ලෙස භාවිතයට ගැනීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී දුම්රිය දෙපාර්තමේන්තුව මඟින් අනුමැතිය ලැබී ඇති බව බදුල්ල දිස්ත්‍රික් ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. | | දිස්ත්‍රික් ලේකම් බදුල්ල<br><br>දුම්රිය දෙපාර්තමේන්තුව |
| | ව්‍යාපෘතීන් සඳහා, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් නිදහස් කිරීමට හෝ බැහැර කිරීමට ප්‍රථම නාගරික සංවර්ධන අධිකාරියේ පූර්ව නිර්දේශයන් ලබා නොගැනීම සම්බන්ධව පවතින ගැටළුවේදී රජයේ ඉඩම්වලට ප්‍රකාශන ඔප්පු ලියන ලද ව්‍යාජ බලපත්‍ර පිළිබඳ විශේෂ විමර්ශනයක් සිදු කර ඒවා අවලංගු කිරීමට කටයුතු කරන ලෙස අම්පාර දිස්ත්‍රික් ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. | | දිස්ත්‍රික් ලේකම් අම්පාර<br><br>ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව |

| | | |
|---|---|---|
| බේරුවල වෙරළ උද්‍යාන ව්‍යාපෘතියට අදාළ ඉඩම් නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීම සම්බන්ධව අනුමැතියට යවා ඇති බව ගාල්ල දිස්ත්‍රික් ලේකම් විසින් දන්වන ලදී. | | දිස්ත්‍රික් ලේකම් ගාල්ල<br>නාගරික සංවර්ධන අධිකාරිය |
| මොරොන්තුඩුව නගර සංවර්ධන ව්‍යාපෘතියට අදාළව මානක සැලැස්ම පිළියෙල කර ගැනීම සම්බන්ධව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත යොමු කර අනුමැතියට ඉදිරිපත් කළ යුතු බව ලේකම්තුමා විසින් දන්වන ලදී | | කළුතර දිස්ත්‍රික් ලේකම්<br>නාගරික සංවර්ධන අධිකාරිය |
| ගම්පහ පොදු වෙළෙඳපොල සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ගම්පහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කාර්යාලය නැවත වෙනත් ස්ථානයක ස්ථාපනය කිරීමේ යෝජනාව (නාගරික සංවර්ධන අධිකාරිය) | සියළුම ආයතන සම්බන්ධ වී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී මේ සම්බන්ධයෙන් සාකච්ඡා කළ යුතු බව ගම්පහ දිස්ත්‍රික් ලේකම් විසින් දන්වන ලදී. | නාගරික සංවර්ධන අධිකාරිය<br>දිස්ත්‍රික් ලේකම් ගම්පහ |

## 07. කර්මාන්ත අමාත්‍යාංශය/ ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතන

කර්මාන්ත අමාත්‍යාංශය විසින් කරන ලද ඉදිරිපත් කිරීම:-

| ගැටලුව/ කරුණ | සාකච්ඡා කළ කරුණු/ ගන්නා ලද තීරණ | වගකීම |
|---|---|---|
| සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් සඳහාම අවම වශයෙන් එක් කර්මාන්තයක් බැගින් ස්ථාපිත කරමින් කර්මාන්ත ව්‍යාප්තිය සමතුලිත කිරීම හා කර්මාන්ත ක්ෂේත්‍රයට යොමු වූ ව්‍යවසායකයන් උපරිම ලෙස දිරිගන්වා කාර්මික සංවර්ධනය ප්‍රාදේශීය මට්ටම දක්වා ව්‍යාප්ත කිරීම සඳහා අවශ්‍ය මූලික තොරතුරු ලබා දෙන ලෙස දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් ඉල්ලීමක් කරන ලදී. | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්<br>කර්මාන්ත අමාත්‍යාංශය |

| | | |
|---|---|---|
| දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට ආවේණික සම්පත් හා ආවේණික කර්මාන්ත වැඩිදියුණු කිරීමට අපේක්ෂා කරන බව දන්වන ලදී. | | |
| මෙම කර්මාන්ත ආරම්භ කිරීමට ඉඩම් අවශ්‍ය වන අතර අවමය අක්කර 2 කට නොඅඩු සුදුසු ඉඩම් හඳුනාගෙන අමාත්‍යාංශය වෙත දන්වා එවන ලෙස ප්‍රකාශ කරන ලදී | | |
| ඉදි කිරීමට අවශ්‍ය කරන කර්මාන්තය පිළිබඳව දන්වන්නේ නම් ඒ සඳහා ඉඩම් හඳුනාගැනීම පහසු බව පුත්තලම දිස්ත්‍රික් ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. නමුත් පළමුව තොරතුරු ලබා ගැනීම අවශ්‍ය වන බව කර්මාන්ත අමාත්‍යාංශය දන්වන ලදී | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්<br>කර්මාන්ත අමාත්‍යාංශය |
| බස්නාහිර පළාතෙන් ඔබ්බට මෙම කර්මාන්තපුර ඇති කිරීමේ ක්‍රියාවලියට දිස්ත්‍රික් ලේකම්වරුන් දායක කර ගැනීම මෙහි මූලික පරමාර්ථය වී ඇති බවත් මෙමඟින් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු කරා යාමට හැකියාව ලැබෙන බවත් දැන්වීය. | | |
| රත්නපුර දිස්ත්‍රික්කයෙන් ඉඩම් 14 ක් පිළිබඳ තොරතුරු කර්මාන්ත අමාත්‍යාංශය වෙත දන්වා ඇති බවත් ඒවා ලියාපදිංචි කරගැනීම සම්බන්ධව පිළිතුරක් ලබා දෙන ලෙස රත්නපුර දිස්ත්‍රික් ලේකම් විසින් ඉල්ලීම් කරන ලදී. | | |
| | | |

ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය විසින් ඉදිරිපත් කරන ලද ගැටළු:-

| ගැටලුව/ කරුණ | සාකච්ඡා කළ කරුණු/ ගන්නා ලද තීරණ | වගකීම |
|---|---|---|
| රටෙහි රබර් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා අම්පාර, මොනරාගල දිස්ත්‍රික්කයන්හි නොමඳ දායකත්වය ලබා දෙන බවත් රබර් වගා කිරීමට කැමැත්තක් දක්වන දිස්ත්‍රික්ක සඳහා එක් පුද්ගලයෙකුගෙන් අවමය ඉඩම් හෙක්ටයාර් 01 ක්වත් ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදී. | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරු<br>ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය |
| ගොවීන් රැස් කිරීමට "තුරු සවිය" සමිතියට අවශ්‍ය සහය දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ මැදිහත්වීම තුළ ලබා දෙන්නේ නම් යෝග්‍ය වන බව දන්වන ලදී. | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරු |
| රබර් වගා ප්‍රවර්ධන කටුයුතු සඳහා පුද්ගලයින් දැනුවත් කිරීමට ග්‍රාම නිලධාරින්, සමෘද්ධි නිලධාරින්, කෘෂි පර්යේෂණ නිලධාරින් ආදී ප්‍රාදේශීය මට්ටමේ සේවය කරන නිලධාරින් ගෙන් සහය ලබා ගැනීම මඟින් මෙම කටයුතු සාර්ථක කර ගැනීමට හැකියාව ලැබෙන බව දන්වන ලදී.ඒ පිළිබඳව සොයා බලා නිවැරදි කරන බව රබර් පර්යේෂණායතනය දන්වා සිටින ලදී. | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරු<br>ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය |
| වවුනියාව දිස්ත්‍රික්කයේ 2013 වර්ෂයේ අක්කර 45 ක් වගා කර ඇති අතර මේ වනවිට අක්කර 16 ක් පමණක් තිබෙන බව දිස්ත්‍රික් ලේකම් විසින් දන්වන ලද අතර නඩත්තුව නිවැරදිව සිදු වී නොමැති බැවින් මෙම වගාවට හානි සිදු වී ඇති බව දන්වා සිටින ලදී.ඒ පිළිබඳ සොයා බලා නිවැරදි කරන බව රබර් පර්යේෂණ නිලධාරින් දන්වා සිටින ලදී. | | දිස්ත්‍රික් ලේකම් වවුනියාව<br>ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය |

## 08. කම්කරු දෙපාර්තමේන්තුව

2021 - ළමා ශ්‍රමය තුරන් කිරීමේ ජාත්‍යන්තර වර්ෂය පිළිබඳ දැනුවත් කිරීම සම්බන්ධව:-

| ගැටලුව/ කරුණ | සාකච්ඡා කළ කරුණු/ ගන්නා ලද තීරණ | වගකීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 2021 වර්ෂය ළමා ශ්‍රමය තුරන් කිරීමේ වර්ෂය ලෙස නම් කර ඇති බවත් 2025 වනවිට ළමා ශ්‍රමය යොදා ගැනීම ශුන්‍ය බවට පත් කිරීම සඳහාත් ශ්‍රී ලංකාව ප්‍රතිඥා ලබා දී ඇති බව සඳහන් කරන ලදී. | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරු<br><br>කම්කරු දෙපාර්තමේන්තුව |
| 2021 01.18 දින සිට ළමුන් සේවයේ යෙදවිය හැකි අවම වයස අවුරුදු 16 ලෙස සංශෝධනය කර ඇත. | | |
| මත්පැන් - දුම්කොළ, ගල්කොරි, රබර් නිෂ්පාදන, සම් පදම් කිරීම, යන්ත්‍ර සූත්‍ර භාවිතය ආදී අනතුරුදායක රැකියා 50 ක් හඳුනාගෙන ඇති බවත් එවැනි කටයුතු සඳහා ළමුන් යොදවා ගැනීම නීති විරෝධී බව දන්වන ලදී. | | |
| දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ළමා මෙහෙයුම් කමිටු රැස්වීම්වලදී මේ පිළිබඳව අවධානය යොමු කරවීම සිදු කළ යුතු බව අවධාරණය කරන ලදී. | | |
| කොවිඩ්-19 වසංගත කාලය තුළ පාසල් හැරගිය ළමුන් සඳහා උපදේශනයක් ලබා දී නැවත පාසල් වෙත යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු බව කළුතර දිස්ත්‍රික් ලේකම් විසින් දන්වන ලදී. ඊට අදාළ තොරතුරු යොමු කරන ලෙස දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත කම්කරු දෙපාර්තමේන්තුව විසින් දන්වන ලදී. | | |

09. **ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය/ අධ්‍යාපන අමාත්‍යාංශය/ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

විවෘත විශ්ව විද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ කරුණු දැක්වීම:

| ගැටලුව/ කරුණ | සාකච්ඡා කළ කරුණු/ ගන්නා ලද තීරණ | වගකීම |
|---|---|---|
| කොවිඩ් 19 තත්වය යටතේ පාසල් සිසුන්ගේ අධ්‍යාපන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අන්තර්ජාලය සහ සුහුරු උපකරණ ආරක්ෂාකාරී භාවිතය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහ ග්‍රාම නිලධාරීන්ගේ සහය ලබා ගැනීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම්වරුන් දැනුවත් කරන ලදී. | | අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්ව විද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය<br><br>සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |
| ළමුන්ගේ අධ්‍යාපනය දියුණු කිරීම සඳහා දත්ත සඳහා අය කිරීමකින් තොරව (Free Data) e-තක්සලාව වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වන ලදී. | | |
| ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිතායතනයත් සමඟ සම්බන්ධ වී වර්ෂයක් තුළ සෑම ළමයෙකු සඳහාම අන්තර්ජාල පහසුකම් සැපයීම සඳහා කටයුතු කර ඇති බව දන්වන ලදී. | | |
| ගුරු හිඟයක් ඇති පාසල් සඳහා ඉගැන්වීම් කටයුතු කිරීමට විෂය නිර්දේශයට අදාළ පාඩම්වල වීඩියෝපට සකස් කර ඒ තුළින් යම් කාල සටහනකට අනුව ඉගැන්වීමත්, මේ සඳහා පාසලකට රූපවාහිනී යන්ත්‍ර 02 බැගින් ලබා දීමටත් කටයුතු කරන බව දන්වන ලදී. | | |

ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ කරුණු දැක්වීම:-

| ගැටලුව/ කරුණ | සාකච්ඡා කළ කරුණු/ ගන්නා ලද තීරණ | වගකීම |
|---|---|---|
| ග්‍රාමීය ක්‍රීඩා පිටි සංවර්ධනය සහ පාසල් ක්‍රීඩා පිටි සංවර්ධනය පිළිබඳ දැනුවත් කිරීම සම්බන්ධයෙන් "එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට එක් ක්‍රීඩා පිටියක්" යන වැඩ සටහන යටතේ හඳුනාගත් ව්‍යාපෘති සඳහා කොට්ඨාසයකට රු. ලක්ෂ 15 බැගින් මුදල් ප්‍රතිපාදන ලබා දී ඇති බවත් එයින් සමහර ව්‍යාපෘති කොටස් වශයෙන් සම්පූර්ණ කර ඇති බවත් ඉතිරිය ඉතා ඉක්මනින් අවසන් කිරීමට කටයුතු කරන බවත් ඒ සම්බන්ධයෙන් ලබා දෙන සහයෝගය සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන්ට ස්තූතිය ප්‍රකාශ කර සිටින ලදී. | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |
| එක් කලාපයකට එක් පාසලක් බැගින් තෝරා ගෙන ක්‍රීඩා පිටි සංවර්ධනය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ හා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගය ඇතුව එක් පාසලකට උපරිමය රු.මිලියන 3.2 ක් බැගින් පාසල් 100 ක ක්‍රීඩා පිටි මේ වර්ෂය තුළ සංවර්ධනය කිරීමට යෝජිත බවත් එය සිදු කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සහය ලබාදෙන ලෙසත් ඉල්ලා සිටින ලදී. | | |
| රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට ප්‍රාදේශීය සභාව සඳහා බැකෝ යන්ත්‍රයක් නොමැතිකම හේතුවෙන් කිරිඇල්ල ව්‍යාපෘතිය සිදු කිරීමට අපහසු වී ඇති බවත් ඒ සඳහා අනුමැතිය ලබාදෙන ලෙස රත්නපුර දිස්ත්‍රික් ලේකම් විසින් ඉල්ලා සිටින ලද අතර | | රත්නපුර දිස්ත්‍රික් ලේකම්<br>කුරුවිට ප්‍රාදේශීය සභාව |

| | | |
|---|---|---|
| ඒ සඳහා අනුමැතිය ලබා දීමට කටයුතු කරන බවත් දන්වන ලදී. | | |

**10. සෞඛ්‍ය අමාත්‍යාංශය**

ආරක්ෂිත ප්‍රජා වැඩසටහන් පිළිබඳ දැනුවත් කිරීම සම්බන්ධව ඉදිරිපත් කරන ලද කරුණු:

| ගැටලුව/ කරුණ | සාකච්ඡා කළ කරුණු/ ගන්නා ලද තීරණ | වගකීම |
|---|---|---|
| 2019 වර්ෂයට සාපේක්ෂව ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් සිදු කරන ලද පරීක්ෂණයන්ට අනුව වාර්ෂිකව මුළු මරණ සංඛ්‍යාව 146,000 ආසන්න ප්‍රමාණයක් වන බවත් මින් බෝ නොවන රෝග හේතුවෙන් වසරකට මරණ 121,180 ක් හා දෛනිකව මරණ 332 ක් සිදුවන බවත් දන්වන ලදී. | | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| Safe Community Programme මඟින් රෝගී වන හා අනතුරට පත්වන පුද්ගලයින් සංඛ්‍යාව අවම කර ගැනීම මෙහි අරමුණ වී ඇති බව සඳහන් කරන ලදී. | | |
| මෙම Non Health Sector සහභාගී කර ගෙන දිස්ත්‍රික් මට්ටමින්, ප්‍රාදේශීය මට්ටමින්, ගම් මට්ටමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් ඉල්ලීම් කරන ලදී. | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |
| ආරක්ෂිත ප්‍රජා වැඩ සටහන් දැනුවත් කිරීමේදී ප්‍රාදේශීය මට්ටමින් ගැටෙන ග්‍රාම නිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන්, සමෘද්ධි නිලධාරීන්, කෘෂි පර්යේෂණ නිලධාරීන් වැනි රජයේ නිලධාරීන් හා සෞඛ්‍ය කණ්ඩායම් ඒකාබද්ධව වැඩසටහන් ක්‍රියාත්මක කරමින් ප්‍රජාව දැනුවත් කළ යුතු බව දන්වන ලදී. | | |

| | | |
|---|---|---|
| **11. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව** | | |
| හැඳුනුම්පත් නොමැති ආබාධිත හා ඉතා වයස්ගත පුද්ගලයන්ගේ හැඳුනුම්පත සකස් කිරීමට online ඡායාරූප ලබා ගැනීමේ ගැටළුව (ගාල්ල දි.ලේ) | අබාධිත හා වයස්ගත පුද්ගලයන් වෙත ගොස් අවශ්‍ය online ඡායාරූප ගැනීමේ පහසුකම් සලසා ඇති බව හා මේ සඳහා රු. 150/- මුදලක් අය කරන බවත් දන්වන ලදී. | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව |
| **12. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව/ මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව** | | |
| ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අනුයුක්ත සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු නිලධාරීන් සේවා අවශ්‍යතාව මත සතියේ සඳුදා දිනය ක්ෂේත්‍ර කටයුතු සඳහා මුදා හැරීම සම්බන්ධව. (ගම්පහ දි.ලේ) | සියලුම නිලධාරීන් සඳහා සඳුදා දිනය කාර්යාල දිනයක් ලෙස ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් ප්‍රකාශයට පත් කර ඇතත් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳුදා දින මුදාහරින ලෙස අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉල්ලීම් කර ඇති බවත් එම නිලධාරීන්ට පමණක් එවැනි විශේෂ අවසරයක් දීමේ හැකියාවක් නොමැති බවත් ගම්පහ දිස්ත්‍රික් ලේකම් විසින් කරන ලද සඳහනට ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් නිකුත් කරන ලද චක්‍රලේඛ අනුව සියලුම නිලධාරීන්ට එක හා සමාන ලෙස සැලකිය යුතු බැවින් එම ඉල්ලීම ඉටු කිරීමට නොහැකි බව සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් සඳහන් කරන ලදී. | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව |
| දිස්ත්‍රික්කයේ මිනුම් සේවා අධීක්ෂණ කටයුතුවලට දිස්ත්‍රික්කය සඳහා පත් කර ඇති වත්මන් කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම මත දිස්ත්‍රික්කයේ මිනුම් සේවා කටයුතු පවත්වා ගැනීමේදී ඇතිවී ඇති දුෂ්කරතා සම්බන්ධව (කොළඹ දි.ලේ) | දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් මේ සඳහා ඉල්ලීම් ඉදිරිපත් කරන්නේ නම් වඩා සුදුසු වන බවත් අනුමත කාර්ය මණ්ඩලය වැඩි කර ගැනීමට අවශ්‍ය කටයුතු කරන බවත් සහකාර අධ්‍යක්ෂ විසින් ප්‍රකාශ කර සිටින ලදී. | මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව<br><br>සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |

## 13. පොලිස් මූලස්ථානය

ශ්‍රී ලංකා පොලිසිය විසින් ඉදිරිපත් කිරීම:-

| ගැටලුව/ කරුණ | සාකච්ඡා කළ කරුණු/ ගන්නා ලද තීරණ | වගකීම |
|---|---|---|
| උතුරු නැගෙනහිර පළාත්වල ගැටලු පවතින බැවින් එම ප්‍රදේශවල තිබූ කුලී නිවෙස්වල පවත්වාගෙන ගිය පොලිස් ස්ථාන කැඩී බිඳී ගොස් තිබූ බවත් නව පොලිස් ස්ථාන ඉදි කිරීමට ඉඩම් ලබාගැනීමේදී ගැටලු මතු වූ බවත් ඉඩම් කට්ටි සොයා දෙන ලෙසත් ඉල්ලීම් කරන ලදී. | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |
| යම් යම් ප්‍රදේශවල උද්ඝෝෂණ ආදී ගැටලු මතුවූ විට පොලිසියට පමණක් එම ගැටළු විසඳීමට අපහසු බැවින් පොලිස් ආරක්ෂාව යටතේ නිලධාරියෙකු එම අවස්ථාවලදී ඉදිරිපත් කරන ලෙස දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් ඉල්ලීමක් කරන ලදී. | | ශ්‍රී ලංකා පොලිසිය<br><br>සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |
| Cyber Crime Division ආරම්භ කිරීමට අනුමැතිය හිමි වී ඇති බවත් ඉදිරියේදී ඒවා කොටස් වශයෙන් ආරම්භ කිරීමට නියමිත බවත් පුත්තලම දිස්ත්‍රික් ලේකම්ගේ විමසීමකට නියෝජ්‍ය පොලිස්පති විසින් සඳහන් කර ලදී. | | ශ්‍රී ලංකා පොලිසිය |
| මොනරාගල දිස්ත්‍රික්කයේ පොලිස් බල ප්‍රදේශ 04 ක් යටතේ දිස්ත්‍රික්කයේ යම් යම් කොටස් පාලනය වන බැවින් විවිධ ගැටලුවලට මුහුණ පෑමට සිදුවන බව දන්වන ලදී. | | ශ්‍රී ලංකා පොලිසිය<br><br>සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |

| | | | |
|---|---|---|---|
| | වැලි බලපත්‍ර නිකුත් කිරීමේදී ගමනාන්තය පැහැදිලිව සලකුණු කළ යුතු බවත් භූ විද්‍යා හා පතල් කාර්යාංශය මගින් කැනීම් බලපත්‍ර ලබා දීමේදී කැනීම් කරන ස්ථානය පිළිබඳව නිශ්චිතව සඳහන් නොකිරීම මත ගැටලු ඇති වන බවත් එය නිවැරදිව සලකුණු කළ යුතු බවත් දන්වා සිටින ලදී. | | භූ විද්‍යා හා පතල් කාර්යාංශය |
| | මහවැලි සංවර්ධන අධිකාරිය හා සම්බන්ධ උද්ඝෝෂණ නිරන්තරයෙන් ඇති වන බවත් එවැනි කටයුතුවලදී සහයෝගය ලබා දීමට දිස්ත්‍රික් ලේකම්වරුන් කටයුතු කරන ලෙස දන්වා සිටින ලදී. | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |
| | වන අලි ගම් වැදීම හා ගවයන්ගෙන් වන හානි හා මාර්ග සංවර්ධන අධිකාරියන් නිකුත් කරන වැලි බලපත්‍ර සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස දන්වන ලදී. | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |
| | පුරාවිද්‍යාව සම්බන්ධ ගැටලු පවතින ප්‍රදේශවලදී එය පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථානයක්ද යනවග වෙන් වෙන් වශයෙන් හඳුනාගත හැකි නම් ගැටලු අවම වන බව දන්වන ලදී. | | පුරාවිද්‍යාව දෙපාර්තමේන්තුව |
| | කසල බැහැර කිරීම සම්බන්ධව ස්ථිර විසඳුමක් හෝ ගනු ලැබූ විසඳුම් සම්බන්ධව මහජනයා දැනුවත් කළ යුතු බව | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |
| | ධීවරයන් යම් යම් ප්‍රදේශවල නිසි පරිදි ලියාපදිංචි නොවීම මත වෙරළ ආරක්ෂණයේදී ගැටලු ඇති වන බැවින් මේ සම්බන්ධව නිසි නියාමනයක් පැවතිය යුතු බව | | |

| | | |
|---|---|---|
| කාන්තා හිංසනය හා ළමා අපයෝජන අවස්ථාවලදී ග්‍රාම නිලධාරින් මඟින් හෝ ප්‍රාදේශීය ලේකම්වරුන් මඟින් අදාළ පොලිස් ස්ථාන දැනුවත් කළ යුතු බවත් ප්‍රාදේශීය කමිටු පැවැත්වීමේදී පොලීසිය සම්බන්ධ කර ගැනීමේදී කල්වේලා ඇතුව දැනුවත් කරන ලෙස ඉල්ලීම් කරන ලදී. | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |
| අයාලේ යන ගවයන් නිසා අනතුරු සිදුවීම් බහුල වී ඇති බැවින් ඔවුන් බැහැර කිරීම සඳහා ප්‍රාදේශීය සභාව දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු යොදන ලෙස දන්වන ලදී. | | |
| මොනරාගල දිස්ත්‍රික්කයේ කැබිලිත්ත දේවස්ථානයට ඇතුළු වන බැතිමතුන් පිළිබඳ ලිඛිත තොරතුරක් ලබා ගෙන ඔවුන් ඇතුල් කිරීම | | දිස්ත්‍රික් ලේකම් මොනරාගල |
| මේ දිනවල පොලීසියට නව නිලධාරින් බඳවා ගැනීම් සිදු කරන බවත් අ.පො.ස. සා/පෙළ සමත් පිරිස සඳහා අයදුම් කළ හැකි බවත් ඒ සඳහා අයදුම්පත් නිකුත් කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් සිදු කරමින් අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලීය. නව නිලධාරීන් බඳවා ගැනීමේදී ග්‍රාම නිලධාරි වාර්තා කඩිනමින් ලබාදී බඳවා ගැනීම් වේගවත් කිරීමට සහාය ලබාදෙන ලෙස ඉල්ලීම් කරන ලදී. | | ශ්‍රී ලංකා පොලීසිය<br>සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |

14. <u>වැව්ලි අමාත්‍යාංශය/ පරිසර අමාත්‍යාංශය/ වාරි මාර්ග දෙපාර්තමේන්තුව/ පහත්බිම් සංවර්ධන මණ්ඩලය/ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය</u>

| | | |
|---|---|---|
| දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිසර කමිටු පිහිටුවීමට සමගාමීව ග්‍රාමීය පරිසර කමිටු පිහිටුවීමට පරිසර අමාත්‍යාංශයේ උපදෙස් ලබා දුන්න ද මෙම ග්‍රාමීය කමිටු පිහිටුවීම, මෙහෙයවීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පරිසර නිලධාරීන් නොමැතිවීම (කොළඹ දි.ලේ) | රාජ්‍ය සේවා අමාත්‍යාංශයෙන් මේ සඳහා නිලධාරීන් බඳවා ගැනීමට අනුමැතිය හිමි වී ඇති බවත් දිස්ත්‍රික්ක 13ක් සඳහා 181ක් පත්කර යවා ඇති බවත් අතිරේක ලේකම් විසින් දන්වන ලදී.<br><br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිටි පරිසර නිලධාරීන් පරිසර අධිකාරිය යටතට ගෙන ඇති බවත් එම නිලධාරීන් නැවත ප්‍රාදේශීය කාර්යාල වෙත යොමු කරන ලෙසත් කොළඹ දිස්ත්‍රික් ලේකම් විසින් ඉල්ලීම් කරන ලදී.<br><br>පරිසර නිලධාරීන් සඳහා පරිසර අමාත්‍යාංශය මඟින් යම් කිසි බලතල පැවරීමක් සිදුකළ යුතු බව ගම්පහ දිස්ත්‍රික් ලේකම් විසින් අවධාරණය කරන ලදී.<br><br>රත්නපුර දිස්ත්‍රික්කයේ පරිසර නිලධාරීන් හිඟකම නිසා විශාල පරිසර ගැටලු කිහිපයකට මුහුණ දී ඇති බවත් ඒවා විසඳා ගැනීම සඳහා නිලධාරීන් හිඟවීම සම්බන්ධයෙන් රත්නපුර දිස්ත්‍රික් ලේකම් විසින් පරිසර අමාත්‍යාංශ අතිරේක ලේකම් දැනුවත් කරන ලදී. | පරිසර අමාත්‍යාංශය<br><br>රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය |
| ලුණුවිල ගිං ඔය ආශ්‍රිත තෙත් බිම් පරිසර පද්ධති ආරක්ෂා කර ගැනීම සම්බන්ධව (ලුණුවිල ගිං ඔය පරිසරය සුරැකීමේ සමිතිය) | මේ පිළිබඳව පරිසර අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස අතිරේක ලේකම්තුමා විසින් ප්‍රකාශ කරන ලදී. | පරිසර අමාත්‍යාංශය |
| මහවැලි එල් කලාපයට ගැසට් මඟින් වෙන් කර ඇති ප්‍රදේශවල ඉඩම් පරිපාලනය විධිමත් පරිදි මහවැලි අධිකාරියට පවරා දීම.<br><br>මහවැලි සංවර්ධන ව්‍යාපාරය සඳහා ගැසට් කර ඇති ප්‍රදේශයේ නිදහස් නොකිරීම නිසා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අපහසුව. (ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය) | මුලතිවු දිස්ත්‍රික්යේ නයාරු හා කෝකිලායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි කොට්ඨාස 06ක හෙක්ටයාර 15,000ක භූමි ප්‍රදේශය සති 02 ක කාලය තුළ විධිමත් පරිදි පවරාදීම් කටයුතු සිදු කරන බව මුලතිවු දිස්ත්‍රික් ලේකම් විසින් දන්වා සිටින ලදී.<br><br>මාතලේ ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහවැලි අධිකාරියට අයත් ඉඩම් අක්කර 15 ක් අසපුවක් ඉදිකිරීම | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය |

| | | |
|---|---|---|
| | සඳහා ලබා දී ඇති බවත් එය වන අලි රැස්වන ස්ථානයක් බැවින් මෙම අසපුව ඉදිකළ හොත් වන අලි ගම් වැදීමේ අවධානමක් පවතින බවත් දිස්ත්‍රික් ලේකම් විසින් දන්වන ලද අතර ඒ පිළිබඳ අවශ්‍ය කටයුතු සොයා බලා සිදු කරන ලෙස මාතලේ දිස්ත්‍රික් ලේකම් විසින් දන්වන ලදී. | |
| මාතර දිස්ත්‍රික්කයේ ගිං, නිල්වලා හැරවුම ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක්වන්නන් නැවත පදිංචි කිරීම සඳහා නමුණුකුල වැව්ලි සමාගම වෙත දිගු කාලීන බදු පදනම මත ලබා දී ඇති හුලංදාව වත්තේ අක්කර 300ක් පමණ ලබා ගැනීම ඉතා සුදුසු බව<br><br>- මේ සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ එකඟතාවය ලබා ගත් අතර නමුණුකුල වැව්ලි සමාගමේ හා වැව්ලි අමාත්‍යාංශයේ එකඟතාව හිමි නොවීම සම්බන්ධ ගැටළුව (වාරිමාර්ග අමාත්‍යාංශය) | පාර්ලිමේන්තු පනතකින් මේ සඳහා අනුමැතිය ලබාගත යුතු බවත් ඒ සඳහා මෙම වර්ෂයේ අවශ්‍ය කටයුතු සිදු කරන බවත් අගමැතිතුමා විසින් පැවසූ බව මාතර දිස්ත්‍රික් ලේකම් විසින් දන්වන ලදී.<br><br>වැව්ලි සමාගම් වෙත ලබාදී ඇති ඉඩම් මෙවැනි ව්‍යාපෘතිවලට ලබාගැනීමේදී වන්දි ලබාදිය යුතු බවත් එම ඉඩම් කොටසේ වටිනාකම ඒකාබද්ධ අරමුදලට මාරු කරන බවත් සංවර්ධන වටිනාකම පමණක් අදාළ වැව්ලි සමාගමට ලබාදෙන බවත් අතිරේක ලේකම්තුමිය පැහැදිලි කරන ලදී. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| ආසියානු සංවර්ධන මණ්ඩලයේ (ADB) ආධාර යටතේ කුඩා තේ වතු හිමියන්ට ණය ලබාදීම පිළිබඳ දැනුවත් කිරීම (අතිරේක ලේකම් - සංවර්ධන, වැව්ලි අමාත්‍යාංශය) | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලදී මේ සම්බන්ධව ප්‍රාදේශීය ලේකම්වරුන්, හා අනෙකුත් නිලධාරීන්/ කුඩා තේ වතු හිමියන් දැනුවත් කළ යුතු බව දන්වන ලදී.<br><br>නැවත වගාවට යොමු වීමට ශක්‍යතාව අඩු පිරිසක් වන මෙම කුඩා තේ වතු හිමියන් සඳහා ඩොලර් මි. 20 ක ණය යෝජනා ක්‍රමය යටතේ අක්කර 50ට අඩු තේ වතු හිමියන්ට අවුරුදු 10 කාල සීමාව සඳහා ණය ලබා දීම සිදු කිරීම.<br><br>ණය ලබා ගැනීමේ සීමාව උපරිම සීමාව මි.30 කි. අක්කර 10 ට වඩා අඩු පිරිස සඳහා ණය අයකර ගැනීමේදී 10% වට්ටමක් ලබා දෙනු ලබයි.<br>ණය ගෙවීමේදී වසර 02ක සහන කාලයක්ද ලබාදෙන බව දන්වා සිටින ලදී. | වැව්ලි අමාත්‍යාංශය |

| | | |
|---|---|---|
| | තේ වැවීමේදී පරිසරයට සිදුවන හානියට පිළියම් යෙදීම සම්බන්ධයෙන් අදාළ වැවිලිකරුවන් දැනුවත් නොකිරීම ගැටළුවක් වන බව කළුතර දිස්ත්‍රික් ලේකම් විසින් දන්වන ලද අතර පරිසර හානියද/ පාංශු හාදනයද අවම කරගනිමින් තේ වගා කිරීමේ ක්‍රමවේද හඳුන්වාදෙන ලෙස ඉල්ලීමක් කරන ලදී. | |

**15. <u>ආරක්ෂක අමාත්‍යාංශය</u>**

| | | |
|---|---|---|
| වගා කටයුතු සඳහා සතුන්ගෙන් වන හානි අවම කර ගැනීමට තුවක්කු ලබා දීම සම්බන්ධව | දැනට ඉඩම් අක්කර 05 හෝ ඊට වැඩි ප්‍රමාණයක වගා කරන ගොවීන් සඳහා තුවක්කු බලපත්‍ර මේ වන විටත් නිකුත් කරන බවත් ඊට අඩු ඉඩම් ප්‍රමාණයක වගා කරන්නන් හට වනසතුන්ගෙන් වන හානි අවම කර ගත යුතු බැවින් අවම සීමාව අක්කර 02ක ප්‍රමාණයක් වගා කරන ගොවීන් සඳහා තුවක්කු ලබා දීම පිළිබඳ සියලු දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් එකඟ වන ලදී.<br>අවමය අක්කර 02 සීමාව ප්‍රධාන නිර්නායකය ලෙස යොදා ගනිමින් දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් දිස්ත්‍රික් මට්ටමින්ද නිර්ණායක ලබා ගනිමින් නිර්දේශ ඉදිරිපත් කළ යුතු බවත් දන්වන ලදී.<br><br>ඉල්ලුම්කරු සැබෑ ගොවියෙක්ද?, වගා කර තිබේද? යනාදී තොරතුරු ප්‍රදේශයේ ගොවි ජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීන්ගෙන් ලබා ගෙන ඉල්ලුම්කරු නීතිය ඉදිරියේ වරදකරුවෙකු නොවීම යන්න මත පොලිස් වාර්තාවක් ඉදිරිපත් කිරීම වැනි කරුණු, අයදුම් කිරීමේ නිර්නායක ලෙස සැලකිය යුතු බව අමාත්‍යතුමා විසින් වැඩිදුරටත් සඳහන් කරන ලදී.<br><br>කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ආදාල චක්‍රලේඛය නිකුත් කළ පසු දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ප්‍රාදේශීය ලේකම්වරු හා ග්‍රාම නිලධාරිවරුන් දැනුවත් කිරීම් කළ යුතු බවත් ඉන් පසු ගොවි සංවිධාන හා | කෘෂි කර්ම අමාත්‍යාංශය<br><br>අරක්ෂක අමාත්‍යාංශය<br><br>සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |

| | | |
|---|---|---|
| | ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරින් දැනුවත් කිරීම් කළ හැකි බවත් තුවක්කු බලපත්‍ර ලබා ගැනීමට අදාළ අයදුම් පත්‍රය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ලබාදිය යුතු බවත් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය දිස්ත්‍රික් ලේකම් වෙත අනුමැතියට ඉදිරිපත් කළ යුතු බවත් කෘෂිකර්ම අමාත්‍යතුමා විසින් දන්වන ලදී.<br><br>මෙම තුවක්කු ප්‍රයෝජනයට ගත හැක්කේ වගා හානි සඳහා පමණක්ම බැවින් වෙනත් නීති විරෝධී කටයුත්තක් සඳහා යොදාගතහොත් එම බලපත්‍රය එසැනින්ම අවලංගු කිරීම සිදු කරන බවත් ආරක්ෂක ලේකම්තුමා විසින් දන්වා සිටින ලදී.<br><br>ලබා දෙන වායු රයිෆල් ප්‍රමාණය වැඩි කර ගැනීමට හැකියාව ඇත්නම් යෝග්‍ය යැයි අමාත්‍යතුමා විසින් දන්වන ලද අතර නව ඉල්ලීම් සඳහා ආරක්ෂක අමාත්‍යාංශය ආනයනය සඳහා අවසරය ලබාදී ඇති බව අතිරේක ලේකම් විසින් දන්වා සිටින ලදී. | |

| ගැටලුව/ කරුණ | සාකච්ඡා කළ කරුණු/ ගන්නා ලද තීරණ | වගකීම |
|---|---|---|
| ගරු අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාගේ දැන්වීමකට අනුව, රජය මඟින් නොමිලේ පොල් පැල ලබා දීම සිදු කරන බවත් වගා කළ හැකි ඉඩම් හඳුනාගෙන කොපමණ පොල් පැල ප්‍රමාණයක් අවශ්‍ය වන්නේද යන්න දිස්ත්‍රික් මට්ටමින් ඉදිරිපත් කරන ලෙස දන්වා සිටින ලදී. | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |
| මේ වර්ෂය අවසානය වනවිට e-land ව්‍යාපෘතිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 45 ක ක්‍රියාත්මක කිරීමේ කටයුතු සිදු කරන බව දන්වන ලදී. | | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව |

| | | |
|---|---|---|
| e-population ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් සඳහාම පරිගණකයක්, ප්‍රින්ටරයක්, ස්කෑනර් යන්ත්‍රයක් බැගින් අවශ්‍ය වන බවත් ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමට කටයුතු කරන ලෙස දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත උපදෙස් ලබා දෙන ලදී. | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |

**16. <u>මැතිවරණ කොමිෂන් සභාව</u>**

| | | |
|---|---|---|
| මැතිවරණ උපුටන නිකුත් කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් සිදු කළ යුතු බවට මැතිවරණ කොමිෂන් සභාව මඟින් තීරණය කර ඇති අතර, එම තොරතුරු නිකුත් කිරීමට අවශ්‍ය ලේඛන බොහෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ නොමැතිවීම සම්බන්ධව (කොළඹ දි.ලේ) | වසර 05 ක පමණ කාලයක මැතිවරණ උපුටන අවශ්‍ය වන බැවින් මෙම උපුටන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් නිකුත් කිරීම ගැටළුවක් නොවන බව දන්වන ලදී. | මැතිවරණ කොමිෂන් සභාව |

**17. <u>සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය/ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව/ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳව මහ ලේකම් කාර්යාලය/ සමාජ සේවා දෙපාර්තමේන්තුව</u>**

| | | |
|---|---|---|
| දිස්ත්‍රික් සමෘද්ධි සංවර්ධන නිලධාරි පුරප්පාඩු සම්බන්ධයෙන් (ත්‍රිකුණාමලය දි.ලේ) | ඉදිරියේදී සමෘද්ධි සංවර්ධන නිලධාරින් බඳවා ගැනීම සඳහා විභාගයක් පැවත්වීමට නියමිත බැවින් පුරප්පාඩු සම්බන්ධ ගැටළුව විසඳිය හැකි බව දන්වන ලදී. | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව |
| ශ්‍රී ලංකා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ හා සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සංගමය මඟින් ඉදිරිපත් කර ඇති සමෘද්ධි සංවර්ධන කටයුතු සඳහා විධිමත් බලතල පැවරීම හා දීමනා සංශෝධනය සම්බන්ධ ගැටළුව (ප්‍රාදේශීය පාලන අංශය) | දීමනා ලබා දීමේදී දෙපාර්තමේන්තුවේ අරමුදලක් මඟින් ලබා දීමට නම් මණ්ඩලය මඟින් අනුමැතිය ලබා ගත යුතු බවත් සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ට බලය පැවරීමේ ගැටලුවක් පවතින බවත් දන්වන ලදී.<br><br>සමෘද්ධි නිලධාරින්ට හා සමෘද්ධි කළමනාකරුවන්ට විනය කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නොගන්නා බව දිස්ත්‍රික් ලේකම් විසින් කරුණු ඉදිරිපත් කළ අතර එම චෝදනාවට ලක්වන නිලධාරින් එම | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව |

| | | |
|---|---|---|
| | ස්ථානයේම සේවය කරන නිසා පරිපාලනමය ගැටළු ඇතිවීම හා එවැනි විනය කටයුතු සඳහා බලය දිස්ත්‍රික් ලේකම්වරුන්ට පවරන ලෙස දිස්ත්‍රික් ලේකම්වරුන් යෝජනා කළ අතර රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අනුමැතිය නොලැබුණු බවත් දන්වන ලදී. | |
| සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත වී සිටින නිලධාරීන් ස්වේච්ඡා සංවිධාන ලියාපදිංචි කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ රාජකාරි ඉටු කිරීම සඳහා ඔවුන්ට නීත්‍යානුකූල බලය පැවරීම සම්බන්ධ ගැටළුව (පුත්තලම දි.ලේ) | ස්වේච්ඡා සමාජ සේවා පනත යටතේ ලියාපදිංචි සංවිධානවල ලියාපදිංචිය සම්බන්ධව දැනටත් බලතල පවරා ඇත්තේ ප්‍රාදේශීය ලේකම්වරුන් හා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත බවත් නිෂ්කාශන වාර්තා ලබා ගැනීමේ ක්‍රියාවලිය සඳහා නිකුත් කර ඇති චක්‍රලේඛය අනුව මෙම ක්‍රමවේදය වෙනස් වීමක් සිදු වූ බවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මේ සම්බන්ධ නියෝජිත නිලධාරියෙකු පත් කර ඇතත් ප්‍රාදේශීය මට්ටමින් මෙවැනි නිලධාරියෙක් නොමැතිකම හේතුවෙන් මෙම ගැටලුව ඇති වූ බවත් දන්වා සිටින ලදී.ඉදිරියේදී ප්‍රාදේශීය මට්ටමට නිලධාරියෙකු පත් කිරීම පිළිබඳව සලකා බලන ලෙස ඉල්ලීම් කරන ලදී. | රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳව මහ ලේකම් කාර්යාලය |
| ග්‍රාම ශක්ති ප්‍රජා සංවිධානවල ලියාපදිංචිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට පැවරී ඇති බැවින් එවැනි ගිණුම් පරිගණක කටයුතු සිදු කරන ආකාරය පැහැදිලි කර ගැනීම. (අම්පාර දි.ලේ) | මාර්ගගත (Online) ක්‍රමයක් මඟින් මෙම ගිණුම් කටයුතු සිදු කරන බවත් තාවකාලිකව මෙම මුදල් පරිහරණය අත්හිටුවිය යුතු බවත් දන්වා සිටින ලදි.<br><br>සෑම දිස්ත්‍රික්කයකම බොල් ණය පිළිබඳ සොයා බැලීමක් කරන ලෙස මාතලේ දිස්ත්‍රික් ලේකම් විසින් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටින ලදී. | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව |
| **18. <u>කෘෂිකර්ම දෙපාර්තමේන්තුව/ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය</u>** | | |
| ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය සඳහා දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයෙක් නොමැති වීම. (ත්‍රිකුණාමලය දි.ලේ) | මේ වනවිට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය සඳහා දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයෙකු පත් කර ඇති බව අධ්‍යක්ෂ ජනරාල් විසින් සඳහන් කරන ලදී | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| කෘෂිකර්ම පර්යේෂණ නිලධාරීන්ගේ පුරප්පාඩු 100 කට අධික ප්‍රමාණයක් තිබීම. (ත්‍රිකුණාමලය දි.ලේ) | මෙම වර්ෂය තුළ නිලධාරීන් 315ක් බඳවා ගැනීමට නියමිත බැවින් මෙම පුරප්පාඩු පිරවීමට හැකියාව ලැබෙනු ඇති බව අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා සිටින ලදී. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |

| | | |
|---|---|---|
| 2020 යල කන්නය වගා රක්ෂණ වන්දි ගෙවීම මේ දක්වා සිදු නොවීම. (පොළොන්නරුව දි.ලේ) | යල කන්නය සඳහා සියලුම ගෙවීම් මේ වනවිට ගෙවා අවසන් බව සභාපති විසින් ප්‍රකාශ කර සිටින ලදී. | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය |

**19. <u>නිපුණතා සංවර්ධන, පර්යේෂණ හා නව නිපැයුම් අමාත්‍යාංශය</u>**

| ගැටලුව/ කරුණ | සාකච්ඡා කළ කරුණු/ ගන්නා ලද තීරණ | වගකීම |
|---|---|---|
| වෘත්තීය අධ්‍යාපන ආයතන 322 ක සංවර්ධන කටයුතු සඳහා අයවැය මඟින් රුපියල් මි. 3,000ක ප්‍රතිපාදන ලැබී ඇති බවත් මෙම ප්‍රතිපාදන පූර්ණ උපයෝජනය කළ යුතු බැවින් කාර්මික විද්‍යාල (TEC) 30 ක් සහ තාක්ෂණ විද්‍යායතන(COD) 09 ක ආයතන 58ක ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කළ යුතු බැවින් ඒ සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සහය පතන ලදී. (අදාළ දිස්ත්‍රික්ක :- රත්නපුර, බදුල්ල, නුවර, පොළොන්නරුව, කෑගල්ල, කළුතර, යාපනය, මඩකලපුව, කුරුණෑගල, නුවර එළිය, මන්නාරම, අම්පාර, ගාල්ල, හම්බන්තොට) | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |
| දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ඉල්ලීම් ගණනාවක් පවතින බවත් ඉන් ප්‍රජාව පුහුණු කිරීම් වැඩසටහන් හා පුහුණු මධ්‍යස්ථාන ඇති කිරීම පිළිබඳ නිරන්තරයෙන් ඉල්ලීම් සිදුවන බැවින් දැනට තිබෙන වෘත්තීය අධ්‍යාපන ආයතන හා සැසඳීමේදී ප්‍රවේශයේ දුරස්ථභාවය සලකා බලා එසේ දුෂ්කරතා පවතින ප්‍රදේශයන්හි භාවිතයට ගත හැකි ගොඩනැගිලි පවතීනම් ඒ පිළිබඳ දිස්ත්‍රික්ක මට්ටමින් | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්<br><br>නිපුණතා සංවර්ධන පර්යේෂණ හා නව නිපැයුම් අමාත්‍යාංශය |

| | | |
|---|---|---|
| දැනුවත් කරන ලෙස දන්වන ලදී. | | |
| ඇතැම් පාඨමාලාවලින් රැකියා අවස්ථා නොමැති බැවින් එම පාඨමාලා ප්‍රයෝජනයක් නොමැති බව පුත්තලම දිස්ත්‍රික් ලේකම් විසින් කරන ලද කරුණු දැක්වීමකදී වැඩි වශයෙන් ළමුන් යොමු නොවන රැකියා අවස්ථා ඇති පාඨමාලා සඳහා දිරිගැන්වීම් දීමනාවක් ලෙස රු. 4,000 ක මුදලක් ලබා දීමට මෙම වර්ෂයේ සිට කටයුතු කර ඇති බවත් ග්‍රාමීය ප්‍රදේශවල ළමුන් සඳහා කෙටිකාලීන පුහුණු ලබාදීම සඳහා ජංගම ඒකක (Mobile Unit) ඇති කිරීම මේ වර්ෂය තුළදී සිදු කිරීමට අපේක්ෂිත බවත් දන්වන ලදී. | | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |

<u>**ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ගැටළු**</u>

| | | |
|---|---|---|
| ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ අවශ්‍ය කාර්යාල පහසුකම් සැලසීම හා සභාපතිවරුන් වෙත සහයෝගය ලබා දීම සම්බන්ධව (සංවර්ධන අංශය) | ගරු අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කොට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බව ලේකම්තුමා විසින් දන්වන ලදී. | ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය<br><br>සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා නිල සෙවණ ගොඩනැගිලිවල පිටත හා ඇතුළත බිත්තිවල වර්ණ ආලේප කිරීම සම්බන්ධව (සංවර්ධන අංශය) | මෙම ගොඩනැගිලි ඇතුළත ඉඩකඩ ප්‍රමාණය වැඩියෙන් පෙන්වීම හා අඳුරු ස්වාභාවය වළක්වා ගැනීමට ඇතුළත බිත්තිවල සුදු පැහැය හෝ ඊට ආසන්න පැහැයක් මෙන්ම පිටත බිත්ති සඳහා ස්වාධීන පැහැයක් ආලේප කිරීම සුදුසු යැයි යෝජනා විය. | සංවර්ධන අංශය<br><br>සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |
| දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සම්බන්ධ ගැටලු (සංවර්ධන අංශය) | මෙම සම්බන්ධීකරණ කමිටුවලට සහභාගී වන මාධ්‍යවේදීන්ට මාධ්‍ය සාකච්ඡාවක් අදාළ චක්‍රලේඛය අනුව සම්බන්ධීකරණ කමිටුව අවසානයේදී සභාපති හා ලේකම්වරයාගේ සහභාගීත්වයෙන් පැවැත්විය හැකි බව දන්වන ලදී. | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |

| | | |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන සංවර්ධන නිලධාරීන් මඟින් ප්‍රාදේශීය මට්ටමේ සිටින වෘත්තිකයින්ගේ දත්ත පද්ධතියක් සකසා ගැනීමට Pawara Enterprises (PVT) LTD ආයතනය විසින් යොමු කර ඇති ඉල්ලීම සම්බන්ධව (ප්‍රාදේශීය පාලන අංශය) | ග්‍රාම නිලධාරී වසම්වල සිටින සංවර්ධන නිලධාරීන් යොදාගෙන ප්‍රාදේශීය මට්ටමේ සිටින පුහුණු හෝ නුපුහුණු ස්වයං රැකියාවල නියුතු පුද්ගලයින්ගේ දත්ත පද්ධතියක් සකස් කිරීම හා එමඟින් රැකියා සොයන පුද්ගලයින්ට තොරතුරු ලබා ගැනීමට හැකිවන පරිදි වෙබ් අඩවියක් සකස් කිරීම Pawara Enterprises (PVT) LTD ආයතනයේ අරමුණ වන බව සහකාර ලේකම් විසින් දන්වා සිටි අතර මේ සඳහා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය මඟින් මෙම දත්ත පද්ධති සකස් කිරීම් සිදු කරන බවත් පෞද්ගලික ආයතන මෙවැනි කටයුතු සඳහා සම්බන්ධ කර නොගන්නා ලෙසත් දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් අවධාරණය කර සිටින ලදී. | ප්‍රාදේශීය පාලන අංශය |
| ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත රාජකාරී ලැස්තුවක් ලබාදීම (ප්‍රාදේශීය පාලන අංශය) | ප්‍රාදේශීය ලේකම්වරුන්ට පනත් මඟින් ඉටු කළ යුතු රාජකාරී පැවරීමක් කළයුතු බැවින් රාජකාරී ලැයිස්තුවක් සකස් කිරීමට අවශ්‍ය යෝජනා දිස්ත්‍රික් ලේකම්වරු මඟින් ලබාගෙන ඉදිරියේදී කඩිනමින් රාජකාරී ලැයිස්තුවක් නිකුත් කරන බව දැන්විය. | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්<br><br>ප්‍රාදේශීය පාලන අංශය |
| ශ්‍රී ලංකා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ හා සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සංගමය මඟින් 2020.12.02 දින පැවති රැස්වීම් වාර්තාවට අනුව ඉදිරිපත් කර ඇති ගැටළු (ප්‍රාදේශීය පාලන අංශය)<br><br>I. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ධාරිතාවය අනුව ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් මුදල් වෙන් කිරීම.<br><br>II. ප්‍රාදේශීය ලේකම්වරු සහ සහකාර ප්‍රදේශීය ලේකම්වරුන් ඇගයීම. | I. මුදල් වෙන් කිරීම සම්බන්ධ විෂමතාවක් පවතින බැවින් දිසාපතිවරුන්ගේ නියෝජනයක් සහිත කමිටුවක් පත් කර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ධාරිතාව, රජයෙන් හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් මුදල් වෙන් කිරීම සම්බන්ධව ඉදිරි පියවරගැනීමට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ශ්‍රේණිගත කිරීමට කටයුතු කලයුතු බව දැන්විය.<br><br>II. අමාත්‍යාංශය මඟින් ප්‍රශංසා සහතිකයක් නිකුත් කිරීම යෝග්‍ය | ප්‍රාදේශීය පාලන අංශය<br><br>සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |

| | | |
|---|---|---|
| | යැයි දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් යෝජනා වූ අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල කළමනාකරණය මඟින් මෙම කාර්යයන් සිදු කිරීමට ඉදිරියේ පියවර ගන්නා බව අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු) විසින් ප්‍රකාශ කර සිටින ලදී.<br><br>II. සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ගමන් වියදම් දීමනාව නොගෙවීම සම්බන්ධව රත්නපුර දිස්ත්‍රික් ලේකම් විසින් අදහස් දැක්වූ අතර මේ සඳහා උපදෙස් පත්‍රිකාවක් ඉදිරිපත් කරන බව අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු) විසින් ප්‍රකාශ කර සිටින ලදී. | ප්‍රාදේශීය පාලන අංශය |
| ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නියං කාලවලදී ජලය බෙදා දීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට ලබා දී ඇති ජල බවුසර් නඩත්තු කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා දීම (ත්‍රිකුණාමලය දි.ලේ) | මේ සඳහා රු. මි. 2 – 3 ක පමණ ප්‍රතිපාදනයක් අවශ්‍ය බැව් දිස්ත්‍රික් ලේකම් විසින් ප්‍රකාශ කළ අතර මේ සඳහා ආපදා කළමනාකරණ වැය ශීර්ෂයෙන් අතිරේක ප්‍රතිපාදන වශයෙන් අමාත්‍යාංශය හරහා ඉල්ලුම් කිරීම කළ යුතු බවත් ප්‍රධාන මූල්‍ය නිලධාරි විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>**මේ සඳහා දිස්ත්‍රික් ලේකම් මඟින් අමාත්‍යාංශය වෙත ලිපියකින් දන්වන ලෙස ලේකම්තුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.** | ගිණුම් අංශය<br><br>ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම්<br><br>ආපදා කළමනාකරණ අමාත්‍යාංශය |
| පොළොන්නරුව පරිපාලන සංකීර්ණයේ අවසන් අදියරේ පවතින වැඩ කටයුතු නිම කිරීම සඳහා 2020.10.26 දිනැති අංක අමප/20/1743/306/403 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් වෙන් කළ රු. මිලියන 265 ක මුදල් ප්‍රතිපාදන පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් වෙත ලබා ගැනීම. (පොළොන්නරුව දි.ලේ) | ගොඩනැගිල්ලේ අයිතිය නාගරික සංවර්ධන අධිකාරිය සතු වන බවත් මේ අවසන් අදියරේ පවතින වැඩ කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අරමුදල් භාවිත කර සකස් කිරීමටකටයුතු කළ යුතු බවට අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කළ යුතු බව අතිරේක ලේකම් (සංවර්ධන) හට දන්වන ලදී.ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මේ සඳහා වැය කළ නොහැකි බව එහි සඳහන් විය යුතු බවට කරුණු දැක්විය. | නාගරික සංවර්ධන අධිකාරිය<br><br>අතිරේක ලේකම් (සංවර්ධන) |

| | | |
|---|---|---|
| මූ.රෙ.135 යටතේ බලතල පැවරීම සම්බන්ධව (කුරුණෑගල දි.ලේ) | මේ සඳහා බලතල දිසාපතිවරුන් සතුව පවතින බවත් මෙහි ගැටළුවක් නොමැති බවත් සියලුම දිස්ත්‍රික් ලේකම් වරුන් විසින් දන්වා සිටින ලදී. | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |
| DS – 4 ග්‍රාම නිලධාරී පදිංචි සහතික නිකුත් කිරීම පිළිබඳ නිශ්චිත උපදෙස් ලබාදීම. (කොළඹ දි.ලේ)<br>I. දැනට විදේශගතව සිටින පුද්ගලයින්ගේ ඥාතීන් විදේශගත පුද්ගලයා නමින් පදිංචි සහතික නිකුත් කරවා ගැනීම පිණිස සිදු කරන ඉල්ලීම්වලදී ශ්‍රී ලංකාවේ පදිංචි නොමැත්තකුගේ පදිංචිය පිළිබඳ ග්‍රාම නිලධාරී සහතිකය ලබා දීමේ හැකියාව පිළිබඳව<br>II. ඉල්ලුම්කරු හැරුණු විට වෙනත් අයගේ තොරතුරු DS-4 ආකෘතියේ ඇතුළත් කළ නොහැකි නමුත් ඉතාලි තානාපති කාර්යාලය මඟින් ඉතාලියේ සේවය කරන පුද්ගලයින්ගේ විශ්‍රාම වැටුප සම්බන්ධව කටයුතු කිරීමට තොරතුරු ලබාගැනීමේදී DS-4 ආකෘතිය ඉල්ලනු ලබන තැනැත්තාගේ කාලත්‍රයා පිළිබඳ තොරතුරු ද එකී ආකෘතියේ ඇතුළත් කරන ලෙස ඉල්ලීම.<br>III. සන්නද්ධ හමුදාවේ සේවයට බැඳීම සඳහා DS-4 සහතික නිකුත් කිරීමේදී මීට පෙර සන්නද්ධ හමුදාවේ සේවය නොකළ බවට සඳහන් කරන ලෙස දැනුම් දීම. | මේ කරුණු සම්බන්ධව ග්‍රාම නිලධාරී සහතික ලබා දිය නොහැකි බව සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් අවධාරණය කරන ලදී. | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |
| 2020 වර්ෂයේ ක්‍රියාත්මක වූ සපිරි ගමක් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ සංවර්ධන නිලධාරින් සඳහා මෙතෙක් නිවාඩු දින වැටුප් නොගෙවීම. ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව මාසයකට අවම දින 03ක හා උපරිම දින 05කට යටත්ව නිවාඩු දින වැටුප් කඩිනමින් ලබා දීම සම්බන්ධව (රත්නපුර දි. ලේ) | සපිරි ගමක් චක්‍රලේඛයේ සංවර්ධන නිලධාරින් හට නිවාඩු දින වැටුප් ගෙවීම සම්බන්ධව සඳහන් කර නොමැති වීම නිසා මෙම ගැටලුව ඇති වූ බව රත්නපුර දිස්ත්‍රික් ලේකම් විසින් ප්‍රකාශ කර සිටි අතර සංවර්ධන නිලධාරින් යනු මාණ්ඩලික නිලධාරින් ගණයට අයත් නොවන බැවින් අනිවාර්යයෙන් නිවාඩු දින වැටුප් | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |

| | | |
|---|---|---|
| | ගෙවීම අයිතිවාසිකමක් නොවන බවත් එසේ වීම වැරදි පූර්වාදර්ශයක් වන බවත් දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ප්‍රකාශ කර සිටි අතර මෙම සපිරිගමක් ව්‍යාපෘතිය සක්‍රියව ක්‍රියාත්මක වන කාලය තුළ නිවාඩු දින වැටුප් ලබා දීම පිළිබඳව සලකා බැලීමක් සිදු කරන බව අමාත්‍යාංශ ලේකම්තුමා විසින් දන්වා සිටින ලදී. | |
| ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවා සංගමය මගින් යොමු කර ඇති පහත ගැටළු පිළිබඳව දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ අදහස් ලබා ගැනීම (දිස්ත්‍රික් පාලන අංශය)<br>I. දිස්ත්‍රික් ක්‍රම සම්පාදන ලේකම් කාර්යාලයන්හි සේවය කරනු ලබන අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන), 1 ශ්‍රේණියේ නිලධාරින්ගේ කාර්යසාධන වාර්තා ප්‍රමාණය කිරීම 2020 වර්ෂයේ සිට අමාත්‍යාංශය මගින් සිදු නොකර නැවත හරවා එවීම.<br>II. සංවර්ධන නිලධාරින්ගේ ස්ථානමාරු කමිටු පිහිටුවීමේදී ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ නිලධාරින් නොසලකා හැරීම. | 2015.06.10 දින 5/2015 වර්ෂයේ නිකුත් කරන ලද චක්‍රලේඛය පදනම් කරගෙන මෙ ගැටළු ඉදිරිපත් වී ඇති බවත් මෙම චක්‍රලේඛය සංශෝධනය විය යුතු බවත් සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් මෙම අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරු වන බැවින් අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකන් වෙත මෙම ප්‍රමාණනය කටයුතු සඳහා ඉදිරිපත් කිරීම අනවශ්‍ය වැය බරක් හා කාල පමාවක් වන බව පෙන්වා දෙන ලදී. සමීපතම අධීක්ෂකයා ලෙස අතිරේක දිස්ත්‍රික් ලේකම් පාලන, ඇගයීම් කිරීම හා ප්‍රමානණය දිස්ත්‍රික් ලේකම් විසින් ඉටුකිරීමට හැකිවන පරිදි චක්‍රලේඛය සංශෝධනය කළ යුතු බව ලේකම්වරුන් තීරණය කරන ලදී. | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් |
| විමර්ශන අංශය විසින් මූලික විමර්ශනයක් පැවැත්වීමේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් මූලික විමර්ශන සඳහා සහය නොදැක්වීම සහ ඔවුන් චූදිතයින් වූ අවස්ථාවක චෝදනා පත්‍ර නිකුත් කළද ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග නොගැනීම (විමර්ශන අංශය) | චෝදනා පත්‍ර නිකුත් කළද පළාත් රාජ්‍ය සේවයේ නිලධාරින් සම්බන්ධව එම ආයතන මගින් ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් ඇතැම්විට එම කාරණයට සම්බන්ධ මධ්‍යම රජයේ නිලධාරින්ට එරෙහිව පමණක් ක්‍රියාමාර්ග ගැනීම නිසා ඒ සම්බන්ධව පළාත් ප්‍රධාන ලේකම්වරුන් දැනුවත් කිරීමට කටයුතු කිරීම.<br>දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සහය ලබා ගැනීම හේතුවෙන් විමර්ශන | විමර්ශන අංශය |

| | | |
|---|---|---|
| | අංශය වෙත තිබූ ගැටලු 500කට ආසන්න ප්‍රමාණයක් 300 ක ප්‍රමාණයක් දක්වා අඩු කර ගැනීමට හැකියාව ලැබූ බව අතිරේක ලේකම් (විමර්ශන) මහින් අදහස් දක්වන ලදී.<br><br>උතුරු නැගෙනහිර දිස්ත්‍රික්කවලදී මෙම විමර්ශන වාර්තා කැඳවීමේදී නිරන්තරයෙන් නැවත සිහි කැඳවීම් යැවිය යුතු බැවින් මෙම ප්‍රමාදවීම් අවම කර ගැනීමට කටයුතු කරන්නේ නම් ඉතා යෝග්‍ය බව දන්වන ලදී. | |
| දැනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල විමර්ශන ඒකක වෙත අනුයුක්ත කර ඇති විමර්ශන නිලධාරීන් වෙනත් ආයතන වෙත ස්ථාන මාරු කිරීම (විමර්ශන අංශය) | දිස්ත්‍රික්ක වල විමර්ශන ඒකකවල නිලධාරීන්ට අවශ්‍ය පුහුණු ලබා දී තිබීම හේතුවෙන් එම ඒකකවල අනුයුක්ත කර ඇති විමර්ශන නිලධාරීන් වෙනත් ආයතනවලට ස්ථාන මාරු නොකරන ලෙස අතිරේක ලේකම් (වමර්ශන) විසින් ඉල්ලීම කරන ලදී. | විමර්ශන අංශය/ සියලුම දිස්ත්‍රික් ලේකම්වරු |
| සේවා කාලය වසර 05 කට වැඩි ප්‍රාදේශීය ලේකම්වරුන්, සංවර්ධන නිලධාරීන් සහ ග්‍රාම නිලධාරීන් ස්ථාන මාරු කිරීම හා අධීක්ෂණය කිරීම. (විමර්ශන අංශය) | විශේෂයෙන්ම උතුරු නැගෙනහිර පළාත් වල නිලධාරීන් ස්ථානමාරු කිරීම නිසා ඉඩම් මංකොල්ලය වළක්වා ගැනීමට හැකියාව ලැබෙනු ඇතැයි දන්වන ලදී. | විමර්ශන අංශය/ සියලුම දිස්ත්‍රික් ලේකම්වරු ස්වදේශ කටයුතු අංශය |
| සංවර්ධන නිලධාරීන්, ග්‍රාම නිලධාරීන් සහ සෙසු රාජ්‍ය නිලධාරීන් විධිමත් පරිදි කාර්යාලවල රැඳී නොසිටීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්වරු හා දිස්ත්‍රික් ලේකම්වරු කටයුතු නොකිරීම. (විමර්ශන අංශය) | විශේෂයෙන්ම ඇතැම් කාර්යාලවල ග්‍රාම නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්, හා අනෙකුත් නිලධාරීන් කාර්යාලවලට පැමිණීම ඉතා අවම මට්ටමක පවතින බවත් ඒ පිළිබඳ අවධානය යොමු කරන ලෙස දිස්ත්‍රික් ලේකම්වරුන් දැනුවත් කරන ලදී. | සියලුම දිස්ත්‍රික් ලේකම්වරු/ සියලුම ප්‍රාදේශීය ලේකම්වරු |
| වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහන 02 විකිණීම සම්බන්ධව (වවුනියාව දි.ලේ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වාහන අඩුවක් පවතින බැවින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් හෝ සකස් කර මෙම වාහන අළුත්වැඩියා | අතිරේක ලේකම් (පාලන) |

| | | |
|---|---|---|
| | කර ගැනීමට හැකි වන්නේ නම් වඩා ලාභදායි වනු ඇති බව පුත්තලම දිස්ත්‍රික් ලේකම් විසින් දන්වන ලදී.<br><br>අලුත්වැඩියා කළ යුතු වාහන දිස්ත්‍රික් මට්ටමින් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලෙස ලේකම්තුමා විසින් දන්වන ලදී. | |
| වෙඩිඩිකුලම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා ප්‍රාදේශීය ලේකම්වරයෙකු පත්කිරීම සම්බන්ධයෙන් (වවුනියාව දි.ලේ) | වෙඩිඩිකුලම් සඳහා ප්‍රාදේශීය ලේකම්වරයෙකු නම් කරන ලද නමුත් ඔහු වැඩ භාර ගැනීම සඳහා නොපැමිණීම මත මෙම ගැටළුව ඇති වූ බවත් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා දැනට රාජ්‍ය පරිපාලන සංචිතයේ සිටින නිලධාරියෙකුගේ ඉල්ලීමක් පවතින බැවින් ඒ සම්බන්ධ ගැටළුවක් නොමැතිනම් එම නිලධාරියා අනුයුක්ත කිරීමේ හැකියාව පවතින බවත් ඒ පිළිබඳ ඉදිරි පියවර ගැනීමට කටයුතු සිදුකරන ලෙස ලේකම්තුමා විසින් උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය පාලන අංශය |
| හිටපු වවුනියාව ප්‍රාදේශීය ලේකම්, වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත අනුයුක්ත කර ඇති අතර ජනවාරි මස සිට මේ වන තෙක් වැටුප් ගෙවීම සඳහා ප්‍රතිපාදන නොලැබීම සම්බන්ධව (වවුනියාව දි.ලේ) | 2020 වර්ෂය සඳහා වැටුප් ගෙවූ නමුත් කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකු නොවන බවත් 1 ශ්‍රේණියේ නිලධාරියෙකු බවත් වැටුප් ගෙවීම සඳහා 2021 වර්ෂයේ ඇස්තමේන්තුවට ඇතුළත් නොකළ බව දන්වා සිටින ලදී.<br><br>රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් මෙම නිලධාරියා වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන වෙත ස්ථානමාරු කිරීමට ලිපියක් එවා ඇති බව සඳහන් කරන ලදි. අදාළ ගොනුව තමා වෙත ඉදිරිපත් කරන ලෙසද ලේකම්තුමා විසින් දැනුම් දෙන ලදී. | ප්‍රාදේශීය පාලන අංශය<br><br>දිස්ත්‍රික් ලේකම් වවුනියාව |
| දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා කාර්යාල උපකරණ හා පරිගණක හිඟවීම. (පොළොන්නරුව දි.ලේ) | අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කරන ලද මුළු ප්‍රමාණයම ලබාදිය නොහැකි බවත් ඉන් කොටසක් ලබා දීමට තීරණය විය. | ගිණුම් අංශය |

| | | |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා ජෙනරේටර් පහසුකම් ලබා ගැනීම සම්බන්ධ ගැටළුව (මන්නාරම දි.ලේ) | මේ වන විට මෙම පහසුකම් ලැබුණු බව දන්වා සිටින ලදී. | දිස්ත්‍රික් ලේකම් මන්නාරම |
| ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ වැය ශීර්ෂ 02 ක් යටතේ වැටුප් ලබන සංවර්ධන නිලධාරීන්ගේ අභ්‍යන්තර ස්ථාන මාරු සම්බන්ධයෙන් පවතින ගැටළුකාරී තත්වයන් නිරාකරණය කර ගැනීම. (කුරුණෑගල දි.ලේ) | වැය ශීර්ෂ දෙකක් පැවතීම ස්ථාන මාරු කිරීමේදී ගැටළුවක් කර නොගන්නා බව ලේකම්තුමා විසින් ප්‍රකාශ කරන ලදී.<br>මෙම වැය ශීර්ෂ දෙකෙහි මාරු කිරීම සම්බන්ධයෙන් ගැටළුවක් කර නොගන්නා ලෙස රත්නපුර දිස්ත්‍රික් ලේකම් විසින්ද ප්‍රකාශ කරන ලදී.<br>අමාත්‍යාංශය විසින්ද මෙම ස්ථාන මාරු කිරීමේ බාධාවක් නොවන බවය උපදෙස් ලිපියක් නිකුත් කර ඇති බවද දැන්වීය. | සියලුම දිස්ත්‍රික් ලේකම්වරු |
| 84 ක් වූ ග්‍රාම නිලධාරීන්ගේ පුරප්පාඩු සම්බන්ධව (මඩකලපුව දි.ලේ) | නව බඳවාගැනීම් කළ යුතු බවත් මේ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂම වෙත ඉදිරිපත් කර ඇති බඳවා ගැනීම් පරිපාටියට අනුමැතිය ලද වහාම බඳවා ගන්නා බව දැන්වීය. | ග්‍රාම නිලධාරී පාලන අංශය |
| ග්‍රාම නිලධාරී, සංවර්ධන නිලධාරී හා සමෘද්ධි සංවර්ධන නිලධාරී විසින් සිය කාර්යාල කොට්ඨාසයේ බහුකාර්ය ගොඩනැගිලි, ප්‍රජා ශාලා, ව්‍යාපාරික ස්ථාන, පෞද්ගලික ස්ථාන ආදියේ පවත්වාගෙන යන බැවින් දිස්ත්‍රික්කය තුළ සේවා පියස නොමැති කොට්ඨාසයන්හි අදාළ වසම් සඳහා නිල සෙවණ ගොඩනැගිලි ස්ථාපිත කිරීම (සංවර්ධන අංශය) | නිල සෙවණ කාර්යාල ඉදි කිරීමේදී ඉල්ලීම් කිරීම සඳහා Web Portal නමින් මෘදුකාංගය පිළිබඳ හඳුන්වාදීමක් කිරීම.<br><br>අලුතින් ඉදිකරන ග්‍රාම නිලධාරී කාර්යාල හා මේ වනවිට ඉදිකර ඇති නමුත් වැඩ අවසන් නොකරන ලද ග්‍රාම නිලධාරී කාර්යාල සම්බන්ධයෙන් කැබිනට් පත්‍රිකාව සකස් කිරීමට අවශ්‍ය නිවැරදි තොරතුරු රැස්කර ගැනීම මෙම Web Portal මෘදුකාංගයේ මූලික අරමුණ වේ.<br><br>දිගින් දිගටම මෙම මෘදුකාංගය යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම අධීක්ෂණ කටයුතු සඳහා පහසුවක් වේ.ඒ අනුව ඉදිරියේදී අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මඟින් කාර්යාල ඉදිකිරීමට ප්‍රතිපාදන ලබාගන්නා බව දැන්වීය. | සංවර්ධන අංශය |

| | | |
|---|---|---|
| සහකාර ප්‍රාදේශීය ලේකම් හා ප්‍රාදේශීය ලේකම් හට ආදායම් සහතික නිකුත් කිරීමට හැකි ආදායම් සීමාව වර්තමානයට ගැලපෙන පරිදි ප්‍රතිශෝධනය කිරීම. (මාතලේ දි.ලේ/ ග්‍රාම නිලධාරි පාලන අංශය) | මේ සම්බන්ධව අප්‍රේල් මස 30 වන දිනට පෙර දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ නිර්දේශ කැඳවීම් කර ඇති අතර ඒවා සැලකිල්ලට ගෙන චක්‍රලේඛයක් නිකුත් කරන බව දන්වා සිටින ලදී. | ග්‍රාම නිලධාරී පාලන අංශය |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා පිරිසිදු කිරීමේ කාර්ය මණ්ඩල අවශ්‍ය බවට ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් සිදුකළ ඉල්ලීම සම්බන්ධව (ත්‍රිකුණාමලය දි.ලේ) | බහුකාර්ය කාර්ය සාධක බලකායේ නිලධාරින් මඟින් මෙම කාර්ය මණ්ඩලය සපුරා ගැනීමට හැකියාව ඇති බව ලේකම්තුමා විසින් දන්වන ලදී | දිස්ත්‍රික් ලේකම් ත්‍රිකුණාමලය |
| සතියේ දින 05 ම කාර්යාලයේ අත්සන් තැබීම වෙනුවට බදාදා දින පමණක් කාර්යාලයට වාර්තා කිරීමටත් ඊට අදාළව දෛනික වාර්තාවන් පවත්වා ගන්නා ලෙසත් කාර්මික නිලධාරින්ට දන්වා තිබූ අනුමැතිය අවලංගු කිරීම සම්බන්ධව (දිස්ත්‍රික් පාලන අංශය)<br><br>කාර්මික නිලධාරින්ගේ ස්ථාන මාරු සම්බන්ධව | රාජකාරි සඳහා කලින් අනුමැතිය ලබාගෙන බැහැරව යන බැවින් දැනට නිකුත් කර ඇති ලිපිය අවලංගු කිරීමට අවශ්‍ය නොවන බවත්, එහි කිසිදු ගැටළුවක් නොමැති බවත් සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් එකඟ වන ලදී.<br><br>අවුරුදු 05 ට වඩා වැඩි සේවා කාලයක් සහිත කාර්මික නිලධාරින්ගේ දිස්ත්‍රික්කය තුළ ස්ථාන මාරු කිරීමේ හැකියාව දිස්ත්‍රික් ලේකම්වරුන්ට ඇති බව ලේකම්තුමා විසින් දන්වන ලදී. | දිස්ත්‍රික් පාලන අංශය<br><br>සියලුම දිස්ත්‍රික් ලේකම්වරු |
| අතිරේක දිස්ත්‍රික් ලේකම් පාලන සහ ඉඩම් තනතුරුවලට නිලධාරින් නම් කිරීම සම්බන්ධව (දිස්ත්‍රික් පාලන අංශය) | දිස්ත්‍රික් ලේකම් වරුන්ගේ අභිමතය පරිදි අතිරේක දිස්ත්‍රික් ලේකම් ඉඩම්/පාලන තනතුරු සඳහා නිලධාරින් නම් කිරීමට හැකියාව ඇති බව ලේකම්තුමා විසින් අවධාරණය කරන ලදී. | දිස්ත්‍රික් පාලන අංශය |
| සංචාරක බංගලා සම්බන්ධව කරුණු දැක්වීම. (අතිරේක ලේකම් - පාලන) | සංචාරක බංගලාවල අධීක්ෂණ කටයුතු සිදු කිරීම දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් සිදු කළ යුතු බවත් බංගලා භාරකරුවන් පුහුණු කිරීම අමාත්‍යාංශය මඟින් ඉදිරියේදී සිදු කරන බවත් රු. 5,000 දීමනාව බංගලා භාරකරු වෙත ලබා දීම කළ යුතු බවත් දන්වන ලදී.<br><br>මාතර දෙනියාය සංචාරක බංගලාව කඩිනමින් විවෘත කළ යුතු බැවින් එම කටයුතු ප්‍රමාද නොකරන ලෙස මාතර දිස්ත්‍රික් ලේකම් හට අතිරේක ලේකම් විසින් උපදෙස් දෙන ලදී. | පාලන අංශය<br><br>සියලුම දිස්ත්‍රික් ලේකම්වරු |

| | | |
|---|---|---|
| | සංචාරක බංගලාවල නාම පුවරු සඳහා ස්ටිකර් කිරීම කඩිනමින් කළ යුතු බවත් ඒ සඳහා ආදර්ශ පුවරුවක් දිස්ත්‍රික්ක සඳහා ඉදිරිපත් කර ඇති බවත් දන්වන ලදී. | |
| වයස අවුරුදු 45ට ඉක්මවා රාජ්‍ය සේවයට බඳවා ගත් නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් හිමිවීම සම්බන්ධව | මෙම නිලධාරීන් හට විශ්‍රාම වැටුප් ගෙවිය යුතු නිසා ඒ සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මඟින් අනුමත කරගත යුතු බැවින් මේ සම්බන්ධව වාර්තාවක් දිස්ත්‍රික් මට්ටමින් කඩිනමින් ඉදිරිපත් කරන ලෙස අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු) විසින් දන්වා සිටින ලදී.ඒ සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත එවා ඇති ලිපියට කඩිනමින් පිළිතුරු සපයන ලෙසද දන්වා සිටින ලදී. | සියලුම දිස්ත්‍රික් ලේකම්වරු |
| කාර්මික නිලධාරීන් සඳහා ඇස්තමේන්තු සකස් කරන සීමාව රු. මි. 3.5 දක්වා වැඩි කිරීම සම්බන්ධව (රත්නපුර දි.ලේ) | තාක්ෂණික නිලධාරීන් සඳහා රු. මි. 3.5 ක් දක්වා වැඩි කිරීම සම්බන්ධව හා තාක්ෂණ සහයක නිලධාරීන් සඳහා රු.මි. 02 ක් දක්වා ලබා දීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණය ලිඛිතව දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ඉදිරිපත් කළ යුතු බව ලේකම්තුමා විසින් උපදෙස් දෙන ලදී.එම උපදෙස් ලිපිය කඩිනමින් ඉදිරිපත් කිරීමට සංවර්ධන අංශයට ලේකම්තුමා උපදෙස් ලබාදෙන ලදී.එම උපදෙස් ලිපිය කඩිනමින් ඉදිරිපත් කිරීමට සංවර්ධන අංශයට ලේකම්තුමා උපදෙස් ලබා දුනි. | සංවර්ධන අංශය |

<u>ලේකම්තුමාගේ සමාප්ති සටහන</u>

මෙම දිසාපති සමුළුව සඳහා සහභාගී වූ සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ස්තුතිය පළ කළ අතර, මෙම දින දෙකෙහි එළැඹි තීරණ අනුව ඉදිරි කටයුතු කිරීමේ වගකීම දිසාපතිවරුන් සතුවන බවත් හා නැවත හමුවීමේ බලාපොරොත්තුවෙන් සමුගන්නා බවත් පැවසිය.

එන්.එච්.එම්. චිත්‍රානන්ද
ලේකම්
ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
"නිල මැදුර" ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.

එන්.එච්.එම්. චිත්‍රානන්ද
ලේකම්
ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය